**සැ. යු. -** 2019.12.16 වැනි දින පළ වූ අංක 2153 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,154 - 2019 දෙසැම්බර් මස 13 වැනි සිකුරාදා - 2019.12.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 2978 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | — |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 2980 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 ජනවාරි මස 03 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 දෙසැම්බර් මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2019 අංක 1033

MOD/DEF/HRM/05/SLAF/PRO/04 .

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
උසස් කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ස්ථිර එයාර් කොමඩෝර් නිලයට උසස් කෙරේ.

තාවකාලික එයාර් කොමඩෝර් දොන් චන්ද්‍රලාල් ඉන්ද්‍රජිත් වීරසූරිය (01661) පරි/රෙජි 2019.10.15

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ජෙනරාල් එස් එච් එස් කෝට්ටේගොඩ (විශ්‍රා),
ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී
වීඑස්වී යූඑස්පී එන්ඩීසී
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2019 නොවැම්බර් මස 13 වැනි දින,
කොළඹ දී ය.

12 - 461/1

---

2019 අංක 1034

MOD/DEF/HRM/03/SLAF/RET/234 .

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
විශ්‍රාම ගැනීමක්

2019 අගෝස්තු මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නා ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ගෲප් කැප්ටන් කොක්කාලිංග ජාතක චන්ද්‍ර ද සිල්වා (01945) - පරිපාලන තූර්යවාදක

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ජෙනරාල් එස් එච් එස් කෝට්ටේගොඩ (විශ්‍රා),
ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී
වීඑස්වී යූඑස්පී එන්ඩීසී
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2019 ජූලි මස 29 වැනි දින,
කොළඹ දී ය.

12 - 461/2

2019 අංක 1035

MOD/DEF/HRM/03/SLAF/RET/233 .

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
විශ්‍රාම ගැනීමක්

2019 ඔක්තෝබර් මස 26 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නා ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ස්කොඩ්රන් ලීඩර් මුතුකුඩ විජයසූරිය ආරච්චිගේ නරේන්ද්‍ර ප්‍රසාද් විජයසූරිය (02140) - පරිපාලන රෙජිමේන්තු

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ජෙනරාල් එස් එච් එස් කෝට්ටේගොඩ (විශ්‍රා),
ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී
වීඑස්වී යූඑස්පී එන්ඩීසී
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2019 ජූලි මස 29 වැනි දින,
කොළඹ දී ය.

12 - 461/3

---

2019 අංක 1036

MOD/DEF/HRM/05/SLAF/RET/252 .

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
විශ්‍රාම ගැනීමක්

2020 ජනවාරි මස 04 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නා ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ස්කොඩ්රන් ලීඩර් චමිල් ප්‍රසන්න ගෝනපිනුවලගේ (02738) - පරිපාලන රෙජිමේන්තු

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ජෙනරාල් එස් එච් එස් කෝට්ටේගොඩ (විශ්‍රා),
ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී
වීඑස්වී යූඑස්පී එන්ඩීසී
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2019 නොවැම්බර් මස 13 වැනි දින,
කොළඹ දී ය.

12 - 461/4

2019 අංක 1037

MOD/DEF/HRM/05/SLAF/RET/256 .

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
විශ්‍රාම ගැනීමක්

2020 ජනවාරි මස 10 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නා ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ස්කොඩ්රන් ලීඩර් මල්වලගේ තිවන්ත ප්‍රභාත් පීරිස් (02291) - පරිපාලන රෙජිමේන්තු

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ජෙනරාල් එස් එච් එස් කෝට්ටේගොඩ (විශ්‍රා),
ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී
වීඑස්වී යූඑස්පී එන්ඩීසී
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2019 නොවැම්බර් මස 13 වැනි දින,
කොළඹ දී ය.

12 - 461/5

2019 අංක 1038

MOD/DEF/HRM/05/SLAF/RET/255 .

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
විශ්‍රාම ගැනීමක්

2020 පෙබරවාරි මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නා ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ස්කොඩ්රන් ලීඩර් චතුර තරින්ද වීරතුංග (02206) - පරිපාලන රෙජිමේන්තු

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ජෙනරාල් එස් එච් එස් කෝට්ටේගොඩ (විශ්‍රා),
ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී
වීඑස්වී යූඑස්පී එන්ඩීසී
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2019 නොවැම්බර් මස 13 වැනි දින,
කොළඹ දී ය.

12 - 461/6

---

MOD/DEF/HRM/05/SLAF/CAS/04 .

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
නෙරපා හැරීමක්

පහත නම සඳහන් නිලධාරියා ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් නෙරපා හැරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කොට ඇත.

ෆ්ලයින් ඔෆිසර් ජයකොඩිගේ බුද්ධිම ගයාන් ජයකොඩි (03607) - විද්‍යුත් ඉංජිනේරු - 2019.10.10

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ජෙනරාල් එස් එච් එස් කෝට්ටේගොඩ (විශ්‍රා),
ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී
වීඑස්වී යූඑස්පී එන්ඩීසී
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2019 නොවැම්බර් මස 13 වැනි දින,
කොළඹ දී ය.

12 - 461/7

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමයි

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව, යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින්මතු "යුනියන් බැංකුව වශයෙන් හඳුන්වන) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019 නොවැම්බර් මස 01 වැනි දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, අකුරැස්ස, මාරඹ, දීගල, වික්‍රම මෙටල් ක්‍රෂර් ව්‍යාපාරයේ අබේවික්‍රම විදාන ගමගේ අනුර (ජාතික හැඳුනුම්පත් අංක 712781882V හිමි) (මෙහි මින්මතු "බන්ධනදායි" වශයෙන් හඳුන්වන) යන අය විසින් අයිරා සහ කාලීන ණය ආකාරයෙන් මූල්‍ය පහසුකම් ලබාගෙන ඇති බැවින් ද, එකී බන්ධනදායී විසින් පිළිවෙලින් රුපියල් 15,000,000ක මුදලක් සඳහා සහ රුපියල් 3,100,000ක මුදලක් සඳහා ප්‍රසිද්ධ නොතාරිස් ආරියසේන පනන්ගල විසින් සහතික කරන ලද අංක 9155 සහ 2015.12.11 දිනැති ප්‍රාථමික උකස් බැඳුම්කරය සහ අංක 9241 සහ 2016.01.26 දිනැති ද්වීතියික උකස් බැඳුම්කරය ලියා අත්සන් කොට තබා, ඉහත කී මූල්‍ය පහසුකම් මත සමාගම් ලියාපදිංචි අංක PB676PQ දරන යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින් මතු යුනියන් බැංකුව වශයෙන් හඳුන්වන) වෙත අයවිය යුතු ඉහත කී මූල්‍ය පහසුකම් සහ ඒ මත පොළිය ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපල උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද,

ඒ අනුව, 2019.06.12 වැනි දිනට ශ්‍රී ලංකා රුපියල් එක්කෝටි දෙලක්ෂ දසදහස් තුන්සිය හැත්තෑ පහකුත් ශත අනූ හතරක (රු. 10,210,375.94) මුදලක් සහ ඒ මත තවදුරටත් පොලියක් එකී බන්ධනදායි වෙතින් යුනියන් බැංකුව වෙත මෙහි පහත සඳහන් පරිදි අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන බැවින් ද,

1. 2019.06.12 වැනි දිනට අංක 634001000000719 දරන ණය පහසුකම මත මුළු හිග මුදල වන ශ්‍රී ලංකා රුපියල් හැටපන් ලක්ෂ හත් දහස් අටසියනවයකුත් ශත අනූහතරක (රු. 6,507,809.94) මුදල සහ ශ්‍රී ලංකා රුපියල් හැට ලක්ෂයක (රු. 6,000,000) මුල් හිග මුදල මත 2019.06.13 වැනි දින සිට වර්ෂයකට 22% බැගින් පොළිය ;
2. 2019.06.12 වැනි දිනට අංක 630101000000832 දරන අයිරා පහසුකම මත හිග මුදල වන ශ්‍රී ලංකා රුපියල් තිස්හත් ලක්ෂ දෙදහස් පන්සිය හැට හයක (රු. 3,702,566) මුදල සහ ඒ මත 2019.06.13 වැනි දින සිට වර්ෂයකට 28% බැගින් පොළිය .

ඉහත කී ණය ශේෂයන් හෝ ඉන් යම් කොටසක් එකී බන්ධනදායී/උකස්කරු විසින් ගෙවා පියවා දැමීම පැහැර හැරීම සිදුකර ඇති බවට යුනියන් බැංකුව විසින් සෑහීමකට පත්වීමෙන් පසුව, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව යුනියන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලය ප්‍රකාරව ක්‍රියා කරමින්, ඉහත කී මූල්‍ය පහසුකම් මත 2019.06.12 වැනි දිනට යුනියන් බැංකුව වෙත ලැබිය යුතු සහ අයවිය යුතු වන ශ්‍රී ලංකා රුපියල් එක්කෝටි දෙලක්ෂ දසදහස් තුන්සිය හැත්තෑ පහකුත් ශත අනූ හතරක (රු. 10,210,375.94) මුදලක් සහ ඉහත කී අනුපාතයෙන් ඉහත දක්වා ඇති පරිදි 2019.06.13 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය තෙක් තවදුරටත් පොළිය සහ තව ද, එකී අංක 9155 සහ 2015.12.11 දිනැති ප්‍රාථමික උකස් බැඳුම්කරය සහ අංක 9241 සහ 2016.01.26 දිනැති ද්වීතියික උකස් බැඳුම්කරය සහ 1990 අංක 4 දරන එකී පනතේ 13 වැනි වගන්තිය යටතේ යුනියන් බැංකුව වෙත අයකර ගැනීමට හිමිකම් ඇති වෙනත් සියලුම මුදල් ප්‍රමාණයන් ද අයකර ගැනීම සඳහා එකී අංක 9155 සහ 2015.12.11 දිනැති ප්‍රාථමික උකස් බැඳුම්කරය සහ අංක 9241 සහ 2016.01.26 දිනැති ද්වීතීයික උකස් බැඳුම්කරය ප්‍රකාරව සහ ඊට යටත්ව යුනියන් බැංකුවට උකසට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වෙන දේපළ ඉහත කී 1990 අංක 4 දරන පනත ප්‍රකාරව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට එල්. බී. සේනානායක ඔක්ෂනියර්ස් වෙත බලය පැවරීමට 1990 අංක 4 දරන එකී පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළයේ, අකුරැස්ස ප්‍රාදේශීය සභා සීමාව තුළ අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හුලංදාව ග්‍රාම නිලධාරි වසමේ මාරඹේ පිහිටි රුක්මලගාවාහේන සහ මුකුරුහුංගාවාගොඩහේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. පී. ඒ. ජයවික්‍රම විසින් මැන සාදන ලද අංක 6587 සහ 1991.01.30 වැනි දින දරන පිඹුරේ නිරූපිත ලොට් A වශයෙන් නිරූපිත බිම් කොටසට බලයලත් මිනින්දෝරු එන්. ඩබ්ලිව්. ආර්. සී. විජේයවන්ත විසින් මැන සාදන ලද අංක 12/1133 සහ 2012.10.30 වැනි දින දරන පිඹුරේ නිරූපිත ලොට් Z වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කළ බිම් කොටසට මායිම්, උතුරට : ලොට් 6D, ලොට් $4^{14}$ සහ අංක 6587 දරන පිඹුරේ නිරූපිත

ලොට් B (නිල්වලා ගගට වෙන්කළ බිම් කොටස) ද, නැගෙනහිරට : අංක 12/1133 දරන පිඹුරේ නිරූපිත ලොට් X සහ අංක 12/1133 දරන පිඹුරේ නිරූපිත ලොට් Y (මීටර් 6ක් පළල ප්‍රවේශ මාර්ගය සඳහා වෙන්කළ බිම් කොටස) සහ T.P. 154181 දරන පිඹුර ද, දකුණට : T.P. 154181 දරන පිඹුර ද, බස්නාහිරට : T.P. 154181 දරන පිඹුර සහ ලොට් 6D ද, යන මෙකී මායිම් තුළ පිහිටි අක්කර දාහතකුත් රූඩ් දෙකයි පර්චස් තිස්අටයි දශම හතයි එකක් (අ. 17, රූ. 2, පර්. 38.71) විශාල බිම් කොටස එහි පස, ගහකොළ, වැවිලි, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් සමග වන අතර, මෙම දේපළ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ Q 11/139 දරන වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ලොට් Z නැවත බෙදා වෙන් කිරීමට අනුව, වර්තමානයේ බලයලත් මිනින්දෝරු එන්. ඩබ්ලිව්. ආර්. සී. විජේයවන්ත විසින් මැන සාදන ලද අංක 13/1186 සහ 2013..02.22 වැනි දින දරන පිඹුරේ මතු සඳහන් පරිදි විස්තර කෙරේ.

මාරඹේ පිහිටි රුක්මලගාවාහේන සහ මුකුරුහුංගාවාගොඩහේන නමැති ඉඩමේ ලොට් A වශයෙන් නිරූපිත බිම් කොටසේ ලොට් Z වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කළ බිම් කොටසට මායිම්, උතුරට : ලොට් 6D සහ මෙම ඉඩමේ ම කොටසක් (අයුතු අල්ලාගැනීමක්) ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ම කොටසක් (අයුතු අල්ලාගැනීමක්) මෙම ඉඩමේ ම ලොට් X, මෙම ඉඩමේ ම ලොට් Y (මීටර් 6ක් පළල ප්‍රවේශ මාර්ගය සඳහා වෙන්කළ බිම් කොටස) සහ T.P. 154181 දරන පිඹුර ද, දකුණට : T.P. 154181 දරන පිඹුර ද, බස්නාහිරට : T.P. 154181 දරන පිඹුර සහ ලොට් 6D ද, යන මෙකී මායිම් තුළ පිහිටි අංක 13/1186 දරන පිඹුර අනුව අක්කර දාසයකුත් පර්චස් විස්සයි දශම දෙකයි බින්දුවක් (අ. 16, රූ. 0, පර්. 20.20) විශාල බිම් කොටස එහි පස, ගහකොළ, වැවිලි, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් බලයලත් මිනින්දෝරු එන්. ඩබ්ලිව්. ආර්. සී. විජේයවන්ත විසින් මැන සාදන ලද අංක 12/1133 සහ 2012.10.30 වැනි දින දරන පිඹුරේ නිරූපිත ලොට් Y (මීටර් 6ක් පළල ප්‍රවේශ මාර්ගය සඳහා වෙන්කළ බිම් කොටස) සහ අංක 6279 දරන පිඹුරේ නිරූපිත ලොට් B2 (මීටර් 3ක්-මීටර් 6ක් පළල පාර) මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමගය.

ප්‍රසිද්ධ නොතාරිස් ටී. එන්. රූබසිංහ විසින් සහතික කරන ලද අංක 10530 සහ 2015.12.10 වැනි දින දරන විකුණුම්කරයේ බලය ප්‍රකාරව සහ ඊට යටත්ව හිමිව අයිතිව සන්තකය දරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

ඉනෝකා ජයවර්ධන
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

12 - 474

## යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමයි

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව, යූනියන්" බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින් මතු "යූනියන් බැංකුව වශයෙන් හඳුන්වන) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019 නොවැම්බර් මස 01 වැනි දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, මාතර, වල්පොල, ශ්‍රී ධර්මවංශ මාවතේ, අංක 212 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන ලියාපදිංචි අංක PV 105813 දරන ටයිල් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ් (මෙහි මින්මතු "බන්ධනදායි" වශයෙන් හඳුන්වන) විසින් සහ එකී ජනරජයේ, මාලඹේ, තලාහේන, බෝගහවත්ත පාරේ, අංක 765/E දරන ලිපිනයේ පදිංචි විතින්ච සම්පත් ගජධීර (ජාතික හැඳුනුම්පත් අංක 713061727V හිමි) (මෙහි මින්මතු "උකස්කරු" වශයෙන් හඳුන්වන) විසින් මූල්‍ය පහසුකම් ගණනාවක් ලබාගෙන ඇති බැවින් ද, එකී බන්ධනදායී සහ උකස්කරු විසින් පිළිවෙලින් රු. 26,000,000 මුදලක් සඳහා සහ රු. 3,800,000ක මුදලක් සඳහා ප්‍රසිද්ධ නොතාරිස් ආරියසේන පනන්ගල විසින් සහතික කරන ලද අංක 9053 සහ 2015.11.03 දිනැති මූලික උකස් බැඳුම්කරය සහ එම නොතාරිස් විසින්ම සහතික කරන ලද අංක 9572 සහ 2016.07.15 දිනැති ද්විතියික උකස් බැඳුම්කරය ලියා අත්සන් කොට තබා, ඉහත කී මූල්‍ය පහසුකම් මත සමාගම් ලියාපදිංචි අංක PB676PQ දරන යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින් මතු යූනියන් බැංකුව වශයෙන් හඳුන්වන) වෙත අයවිය යුතු ඉහත කී මූල්‍ය පහසුකම් සහ ඒ මත පොළිය ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපල උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද,

ඒ අනුව, 2019.08.14 වැනි දිනට ශ්‍රී ලංකා රුපියල් තුන් කෝටි දහනව ලක්ෂ පහළොස් දහස් නවසිය හැට පහකුත් ශත අසූහයක (රු. 31,915,965.86) මුදලක් සහ ඒ මත තවදුරටත් පොලියක් එකී බන්ධනදායි/උකස්කරු වෙතින් යූනියන් බැංකුව වෙත මෙහි පහත සඳහන් පරිදි අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන බැවින් ද,

1. 2019.08.14 වැනි දිනට අංක 114001000051373 දරන ණය පහසුකම මත මුළු හිඟ මුදල වන ශ්‍රී ලංකා රුපියල් විසිපන් ලක්ෂ හත්දහස් දහසයකුත් ශත තිස් දෙකක (රු. 2,507,016.32) මුදල සහ තව ද, ශ්‍රී ලංකා රුපියල් විසිහතර ලක්ෂ පනස් දහස් විසිහයක (රු. 2,450,026) මුල් හිඟ මුදල මත 2019.08.15 වැනි දින සිට වර්ෂයකට 22% බැගින් පොළිය ;

2. 2019.08.14 වැනි දිනට අංක 114001000051514 දරන ණය පහසුකම මත මුළු හිඟ මුදලවන ශ්‍රී ලංකා රුපියල් හතළිස් හත් ලක්ෂ අසූඑක්දහස් තුන්සිය හතළිස් හතකුත් ශත අනූපහක (රු. 4,781,347.95) මුදල සහ තව ද, ශ්‍රී ලංකා රුපියල් හතළිස් හතර ලක්ෂයක (රු. 4,400,000) මුල් හිඟ මුදල මත 2019.08.15 වැනි දින සිට වර්ෂයකට 22% බැගින් පොළිය.

3. 2019.08.14 වැනි දිනට අංක 114001000052434 දරන ණය පහසුකම මත මුළු හිඟ මුදලවන ශ්‍රී ලංකා රුපියල් විසිහත් ලක්ෂ හතළිස් නව දහස් අටසිය හැත්තෑ හතරකුත් ශත හයක (රු .2,749,874.06) මුදල සහ තව ද, ශ්‍රී ලංකා රුපියල් විසිපන් ලක්ෂ අසූතුන් දහස් තුන්සිය දාහතරක (රු. 2,583,314) මුල් හිඟ මුදල මත 2019.08.15 වැනි දින සිට වර්ෂයකට 22% බැගින් පොළිය ;

4. 2019.08.14 වැනි දිනට අංක 114001000052443 දරන ණය පහසුකම මත මුළු හිඟ මුදලවන ශ්‍රී ලංකා රුපියල් දහතුන් ලක්ෂ විසිතුන් දහස් දෙසිය හයකුත් ශත අනූනවයක (රු. 1,323,206.99) මුදල සහ තව ද, ශ්‍රී ලංකා රුපියල් දොළොස් ලක්ෂ අනූඑක් දහස් හයසිය අසූහයක (රු. 1,291,686) මුල් හිඟ මුදල මත 2019.08.15 වැනි දින සිට වර්ෂයකට 22% බැගින් පොළිය ;

5. 2019.08.14 වැනි දිනට අංක 114001000054959 දරන ණය පහසුකම මත මුළු හිඟ මුදල වන ශ්‍රී ලංකා රුපියල් දෙකෝටි පන් ලක්ෂ පනස්හතර දහස් පන්සිය විස්සකුත් ශත පනස් හතරක (රු. 20,554,520.54) මුදල සහ තව ද, ශ්‍රී ලංකා රුපියල් දෙකෝටියක (රු. 20,000,000) මුල් හිඟ මුදල මත 2019.08.15 වැනි දින සිට වර්ෂයකට 22% බැගින් පොළිය ද,

ඉහත කී ණය ශේෂයන් හෝ ඉන් යම් කොටසක් එකී බන්ධනදායී/උකස්කරු විසින් ගෙවා පියවා දැමීම පැහැර හැරීම සිදුකර ඇති බවට යුනියන් බැංකුව විසින් සෑහීමකට පත්වීමෙන් පසුව, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව යුනියන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලය ප්‍රකාරව ක්‍රියා කරමින්, එකී මූල්‍ය පහසුකම් මත 2019.08.14 වැනි දිනට එකී බන්ධනදායී/උකස්කරු වෙතින් යුනියන් බැංකුව වෙත ලැබිය යුතු සහ අයවිය යුතු වන ශ්‍රී ලංකා රුපියල් තුන්කෝටි දහනව ලක්ෂ පහළොස්දහස් නවසිය හැටපහකුත් ශත අසූ හයක (රු. 31,915,965.86) මුදලක් සහ ඉහත දක්වා ඇති පරිදි 2019.08.15 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය තෙක් තවදුරටත් පොළිය සහ තව ද, එකී අංක 9053 දරන මූලික උකස් බැඳුම්කරය සහ එකී අංක 9572 දරන ද්විතියික උකස් බැඳුම්කරය සහ 1990 අංක 4 දරන එකී පනතේ 13 වැනි වගන්තිය යටතේ යුනියන් බැංකුව වෙත අයකර ගැනීමට හිමිකම් ඇති වෙනත් සියලුම මුදල් ප්‍රමාණයන් ද අයකර ගැනීම සඳහා එකී අංක 9053 දරන මූලික උකස් බැඳුම්කරය සහ එකී අංක 9572 දරන ද්විතීයික උකස් බැඳුම්කරය ප්‍රකාරව සහ ඊට යටත්ව යුනියන් බැංකුවට උකසට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දැක්වෙන දේපළ ඉහත කී 1990 අංක 4 දරන පනත ප්‍රකාරව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට එල්. බී. සේනානායක ඔක්ෂනියර්ස් වෙත බලය පැවරීමට 1990 අංක 4 දරන එකී පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මෙයින් යෝජනා කරනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර සහ මාතර මහනගර සභා සීමාව තුළ මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 417C දරන වල්පොල ග්‍රාම නිලධාරි වසමේ වල්පොල ගමේ පිහිටි ශ්‍රී ධර්මවංශ මාවතේ, වරිපනම් අංක 212 (පැරණි වරිපනම් අංක 2143) දරන "අඹගහකොරටුව නොහොත් සබෝගේ අම්මාගේ වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. බී. තිලකසිරි විසින් මැන සාදන ලද අංක 15/2003 සහ 2003 ඔක්තෝබර් මස 30 වැනි දින දරන මානක පිඹුරේ නිරූපිත ලොට් 01 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කළ බිම් කොටසට මායිම්, උතුරට : ජාසිංගේ වත්ත ද, නැගෙනහිරට : වල්පොල පාර ද, දකුණට : ලොට් B ද සහ බස්නාහිරට : අඹගහකොරටුව ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් තිස්හයකුත් දශම අටයි බින්දුවක් (අ. 0, රූ. 0, පර්. 36.80) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි, පළතුරු ආදී සෑම සියලු දේත් සමග වන අතර, මෙම දේපළ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A/637/78 යටතේ ලියාපදිංචි කර ඇත. වර්තමානයේදී මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A/637/137 සහ A/637/144 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

ඉනෝකා ජයවර්ධන,
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

12 - 472

## යුනියන් බැංක් ඔෆ් කලම්බු පීඑල්සී

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ යුනියන් බැංක් ඔෆ් කලම්බු පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමයි

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව, යුනියන් බැංක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින්මතු "යුනියන් බැංකුව" වශයෙන් හඳුන්වන) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019 නොවැම්බර් මස 01 වැනි දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, කලන්කුට්ටිය, ජය මාවත, සෙනරත් ස්ටෝර්ස් යන ලිපිනයේ ටිකිරි බණ්ඩාගේ ගාන්ධි සෙනරත් ටිකිරි බණ්ඩා (ජාතික හැඳුනුම්පත් අංක 196735904956V හිමි) සහ යාපා මුදියන්සේලාගේ චන්ද්‍රලතා මැණිකේ විජේසිංහ (ජාතික හැඳුනුම්පත් අංක 718142733V හිමි) (මෙහි මින්මතු "බන්ධනදායින්" වශයෙන් හඳුන්වන) යන අය විසින් සමාගම් ලියාපදිංචි අංක PB676PQ දරන යුනියන් බැංක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින් මතු "යුනියන් බැංකුව" වශයෙන් හඳුන්වන) ශ්‍රී ලංකා රුපියල් එක් කෝටියක (රු. 10,000,000) ණය පහසුකමක් (මෙහි මින්මතු "එකී ණය පහසුකම" වශයෙන් හඳුන්වන) ලබාගෙන ඇති බැවින් ද, එකී යාපා මුදියන්සේලාගේ චන්ද්‍රලතා මැණිකේ විජේසිංහ යන අය විසින් මෙහි පහත පළමුවන උපලේඛනයේ සවිස්තරව දැක්වෙන දේපළ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රුපියල් 1,300,000 මුදලක් සඳහා අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් එස්. කේ. නදී ආකාෂ් කුරේරා විසින් සහතික කරන ලද අංක 8927 සහ 2018.11.14 දිනැති මූලික උකස් බැඳුම්කරය, මෙහි පහත දෙවන උපලේඛනයේ සවිස්තරව දැක්වෙන දේපළ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රුපියල් 2,200,000 මුදලක් සඳහා එම නොතාරිස් විසින් සහතික කරන ලද අංක 8923 සහ 2018.11.13 දිනැති මූලික උකස් බැඳුම්කරය, මෙහි පහත තුන්වන උපලේඛනයේ සවිස්තරව දැක්වෙන දේපල සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රුපියල් 2,200,000 මුදලක් සඳහා එම නොතාරිස් විසින් සහතික කරන ලද අංක 8921 සහ 2018.11.13 දිනැති මූලික උකස් බැඳුම්කරය සහ මෙහි පහත හතරවන උපලේඛනයේ විස්තරව දැක්වෙන දේපළ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රුපියල් 4,300,000 මුදලක් සඳහා එම නොතාරිස් විසින් සහතික කරන ලද අංක 8919 සහ 2018.11.13 දිනැති මූලික උකස් බැඳුම්කරය ලියා අත්සන් කොට තබා, ඉහත කී මූල්‍ය පහසුකම් මත යුනියන් බැංකුව වෙත අයවිය යුතු ශ්‍රී ලංකා රුපියල් එක්කෝටියක (රු. 10,000,000) මුදල සහ ඒ මත පොලිය ආපසු ගෙවීම සඳහා පොදු ඇපයක් වශයෙන් මෙහි පහත උපලේඛනවල සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළ උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද,

ඒ අනුව ඉහත කී මූල්‍ය පහසුකම් නිසා 2019.06.27 වැනි දිනට මුළු හිඟ මුදලවන ශ්‍රී ලංකා රුපියල් එක්කෝටි තුන් ලක්ෂ අසූහතර දහස් දෙසිය දාහතකුත් ශත පනස්හතක (රු. 10,384,217.57) මුදලක් සහ තව ද, මුල් හිඟ මුදලවන ශ්‍රී ලංකා රුපියල් අනූ අටලක්ෂ තිස්හතර දහස් හයසිය විස්සකුත් ශත අනූහතක (රු. 9,834,620.97) මුදල මත 2019.06.28 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 21% බැගින් තවදුරටත් පොලියක් එකී බන්ධනදායින් වෙතින් යුනියන් බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන බැවින් ද,

ඉහත කී ණය ශේෂයන් හෝ ඉන් යම් කොටසක් එකී බන්ධනදායින් විසින් ගෙවා පියවා දැමීම පැහැර හැරීම සිදුකර ඇති බවට යුනියන් බැංකුව විසින් සෑහීමකට පත්වීමෙන් පසුව, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව යුනියන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලය ප්‍රකාරව ක්‍රියා කරමින්, ඉහත කී මූල්‍ය පහසුකම් මත 2019.06.27 වැනි දිනට මුළු හිඟ මුදලවන ශ්‍රී ලංකා රුපියල් එක්කෝටි තුන් ලක්ෂ අසූහතර දහස් දෙසිය දාහතකුත් ශත පනස්හතක (රු. 10,384,217.57) මුදලක් සහ ඊට අමතරව, මුල් හිඟ මුදල වන ශ්‍රී ලංකා රුපියල් අනූඅට ලක්ෂ තිස්හතර දහස් හයසිය විස්සකුත් ශත අනූහතක (රු. 9,834,620.97) මුදල මත 2019.06.28 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 21% බැගින් තවදුරටත් පොලියක් සහ තව ද, එකී අංක 8927, 8923, 8921 සහ 8919 දරන ඉහත කී උකස් බැඳුම්කර සහ 1990 අංක 4 දරන එකී පනතේ 13 වැනි වගන්තිය යටතේ යුනියන් බැංකුව වෙත අයකර ගැනීමට හිමිකම් ඇති වෙනත් සියලුම මුදල් ප්‍රමාණයන් ද අයකර ගැනීම ප්‍රසිද්ධ නොතාරිස් එස්. කේ. නදී ආකාෂ් කුරේරා විසින් සහතික කරන ලද අංක 8927 සහ 2018.11.14 දිනැති මූලික උකස් බැඳුම්කරය, අංක 8923 සහ 2018.11.13 දිනැති මූලික උකස් බැඳුම්කරය අංක 8921 සහ 2018.11.13 දිනැති මූලික උකස් බැඳුම්කරය සහ අංක 8919 සහ 2018.11.13 දිනැති මූලික උකස් බැඳුම්කරය ප්‍රකාරව සහ ඊට යටත්ව යුනියන් බැංකුවට උකසට තබන ලද මෙහි පහත පළමුවන, දෙවන, තුන්වන සහ හතරවන උපලේඛනවල සවිස්තරව දක්වෙන දේපළ ඉහත කී 1990 අංක 4 දරන පනත ප්‍රකාරව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට එල්. බී. සේනානායක ඔක්ෂනියර්ස් වෙත බලය පැවරීමට 1990 අංක 4 දරන එකී පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මෙයින් යෝජනා කරනු ලැබේ.

### පළමුවන උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, උඩපොල මැදලස්ස කෝරළයේ, දඹදෙනි හත්පත්තුවේ, පොල්ගහවෙල ප්‍රාදේශීය සභා

සීමාව තුළ පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 888 දරන දෙවටගෙදර ග්‍රාම නිලධාරි වසමේ, හේනපොළ ගමේ පිහිටි "පිටන්ගනේවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එම්. එම්. පී. අතපත්තු විසින් මැන සාදන ලද අංක 276 සහ 2010.06.17 වැනි දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 01 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කළ බිම් කොටසට මායිම්, උතුරට : අංක 1039 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 1 වන සහ වර්තමානයේ ඒ. ඒ. ගුණසේකර යන අය විසින් හිමිකම් කියන ඉඩම සහ වදාකඩ පාරේ සිට නිවෙස් දක්වා වැටී ඇති පාර ද, නැගෙනහිරට : නිවෙස්වල සිට වදාකට දක්වා වැටී ඇති පාර ද, දකුණට : අංක 1039 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 3 වන සහ වර්තමානයේ ජේ. බී. රත්නසූරිය විසින් හිමිකම් කියන ඉඩම ද, බස්නාහිරට : රොසලින් යන අය විසින් හිමිකම් කියන ඉඩම සහ අංක 1039 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 1 වන සහ වර්තමානයේ ඒ. ඒ. ගුණසේකර යන අය විසින් හිමිකම් කියන ඉඩම ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් විසිනවයකුත් දශම නවයයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 29.92) නොහොත් හෙක්ටයාර 0.0757ක් විශාල බිම් කැබැල්ල සහ ඒ මත පිහිටි නිවස ඇතුළු සෑම සියලු දේත් සහිතව මෙම ඉඩමේ උතුරු මායිමේ පිහිටි පාරේ මාර්ග අයිතිය සහ එය නඩත්තු කිරීමේ අයිතිය ද සමගය. මෙම දේපළ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ T/169/12 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, මැද පත්තුවේ, අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ. අංක 332 දරන වටද්දර ග්‍රාම නිලධාරි වසමේ වටද්දර ගමේ පිහිටි "කොස්ගහලන්ද නොහොත් හේනේ දකුණු පැත්තේ කැබැල්ල" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. ජී. බන්දුතිලක විසින් මැන සාදන ලද අංක 33828 සහ 2018.06.03 වැනි දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 01 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කළ බිම් කොටසට මායිම්, උතුරට : අංක 601 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 05 (පාර) ද, නැගෙනහිරට : විජේගුණවර්ධන යන අයට අයිති ඉඩම ද, දකුණට : අංක 601 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 04 ද, බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දාසයකුත් දශම පහයි බින්දුවක් (අ. 0, රූ. 0, පර්. 16.50) නොහොත් හෙක්ටයාර 0.0418ක් විශාල බිම් කැබැල්ල සහ ඒ මත පිහිටි සෑම සියලු දේත් සමග වන අතර, මෙම දේපළ අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B/500/85 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

### තුන්වන උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වල්ගම්පත්තු කෝරළයේ, දේවමැදි හත්පත්තුවේ, වාරියපොළ ප්‍රාදේශීය සභා සීමාව තුළ බමුණුකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1221 දරන හෝමාතගම ග්‍රාම නිලධාරි වසමේ හෝමාතගම ගමේ පිහිටි "ඉදපිල්ලෑවේවත්ත", මිල්ලගහමුලවත්ත" නොහොත් හිටිනාගෙදරවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. ඒ. රෝහිත ජයලත් විසින් මැන සාදන ලද අංක 2135 සහ 2018.06.12 වැනි දින දරන පිඹුරේ නිරූපිත ලොට් 01 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කළ බිම කොටසට මායිම්, උතුරට : බලයලත් මිනින්දෝරු එස්. ටී. ගුණසේකර විසින් මැන සාදන ලද අංක 1973 සහ 1963.02.16 වැනි දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 04 ද, නැගෙනහිරට : ජේ. එම්. ටිකිරි බණ්ඩා, ජේ. එම්. විජේතුංග, ජේ. එම්. විමලාවතී සහ ජේ. එම්. සීලවතී යන අය විසින් හිමිකම් කියන ඉඩම සහ බලයලත් මිනින්දෝරු එස්. ටී. ගුණසේකර විසින් මැන සාදන ලද අංක 1973 සහ 1963.02.16 වැනි දින පිඹුරේ නිරූපිත ලොට් අංක 06 ද, දකුණට : දම්පිටියේ සිට හෝමාතගම දක්වා වැටී ඇති පාර (ප්‍රාදේශීය සභා) ද, බස්නාහිරට : බලයලත් මිනින්දෝරු ජේ. ඒ. ආර්. ජයලත් විසින් මැන සාදන ලද අංක 280 සහ 2007.10.22 වැනි දින දරන පිඹුරේ නිරූපිත ලොට් 01 ද, යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් දෙකකුත් පර්චස් දහයක් (අ. 0, රූ. 2, පර්. 10) නොහොත් හෙක්ටයාර බින්දුවයි දශම දෙකයි දෙකයි හතයි හයක් (හෙක් 0.2276) විශාල බිම් කැබැල්ල සහ ඒ මත පිහිටි සෑම සියලු දේත් සමග වන අතර මෙම දේපළ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E/119/59 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

### හතරවන උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, බලදොර කෝරළයේ, දේවමැදි හත්පත්තුවේ, කොබෙයිගනේ ප්‍රාදේශීය සභා සීමාව තුළ කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1296 දරන මිදෙල්ලෑව ග්‍රාම නිලධාරි වසමේ මිදෙල්ලෑව ගමේ පිහිටි "මීගහමුලවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. ජී. බන්දුතිලක විසින් නැවත මැන සාදන ලද අංක 33827 සහ 2018.06.04 වැනි දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 01 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කළ බිම් කොටසට මායිම්, උතුරට : ගම්සභා පාර ද, නැගෙනහිරට : ගම්සභා පාර ද, දකුණට : කේ. එම්. බස්නායකට අයිති ඉඩම ද, බස්නාහිරට : අඹරහාමි යන අයගේ උරුමක්කාරයන්ට අයිති ඉඩම ද යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් දෙකකුත් පර්චස් විසි දෙකයි දශම පහක් (අ. 0, රූ. 2, පර්. 22.5) නොහොත් හෙක්ටයාර 0.2563ක් විශාල බිම් කැබැල්ල සහ ඒ මත පිහිටි නිවස ඇතුළු සෑම සියලු දේත් සමග වන අතර, මෙම දේපළ නිකවැරටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M/54/78 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

ඉනෝකා ජයවර්ධන,
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

12 - 471

## යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනාව පිළිබඳ දැන්වීමයි

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව, යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින්මතු "යූනියන් බැංකුව යනුවෙන් හඳුන්වන) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019 නොවැම්බර් මස 01 වැනි දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, ඇඹිලිපිටිය, මොරකැටිය පාර, මහානාම කලර් හවුස් ඇන්ඩ් ට්‍රේඩ් සෙන්ටර් ආයතනයේ අබේවර්ධන ආරච්චිගේ සහන් ඩිලන්ක (ජාතික හැඳුනුම්පත් අංක 833140698V හිමි) (මෙහි මින්මතු "බන්ධනදායි" වශයෙන් හඳුන්වන) යන අය විසින් සමාගම් ලියාපදිංචි අංක PB676PQ දරන යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින් මතු යූනියන් බැංකුව වශයෙන් හඳුන්වන) වෙතින් මූල්‍ය පහසුකම් ලබාගෙන ඇති බැවින් ද, එකී බන්ධනදායි විසින් පිළිවෙලින් රු. 2,000,000ක මුදලක් සඳහා රු. 2,200,000ක මුදලක් සඳහා, රු. 2,100,000ක මුදලක් සඳහා සහ රු. 6,500,000ක මුදලක් සඳහා ප්‍රසිද්ධ නොතාරිස් නිරෝෂන් රණසිංහ විසින් සහතික කරන ලද අංක 2111 සහ 2014.05.20 දිනැති ප්‍රාථමික උකස් බැඳුම්කරය, අංක 2297 සහ 2014.10.14 දිනැති ද්විතීයික උකස් බැඳුම්කරය, අංක 3903 සහ 2017.11.28 දිනැති තෘතීයික උකස් බැඳුම්කරය සහ අංක 4684 සහ 2019.04.08 දිනැති සිව්වන උකස් බැඳුම්කරය ලියා අත්සන් කොට තබා, යූනියන් බැංකුව වෙත අයවිය යුතු ඉහත කී මූල්‍ය පහසුකම් සහ ඒ මත පොලිය අපාසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපල උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද,

ඒ අනුව, 2019.08.19 වැනි දිනට ශ්‍රී ලංකා රුපියල් එක්කෝටි හතළිස් දෙලක්ෂ අසූ දහස් හාරසිය පනස් තුනකුත් ශත හතළිස් හතක (රු. 14,280,453.47) මුදලක් සහ ඉහත කී මූල්‍ය පහසුකම්වල හිඟ මුල් මුදල මත තවදුරටත් පොලියක් එකී බන්ධනදායි වෙතින් යූනියන් බැංකුව වෙත මෙහි පහත සඳහන් පරිදි අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන බැවින් ද,

1. 2019.08.19 වැනි දිනට අංක 444001000053700 දරන ණය පහසුකම මත මුළු හිඟ මුදල වන ශ්‍රී ලංකා රුපියල් එක්කෝටි විසිනව ලක්ෂ අසූදහස් හාරසිය පනස් තුනකුත් ශත හතළිස් හතක (රු. 12,980,453.47) මුදල සහ ශ්‍රී ලංකා රුපියල් එක්කෝටි විසිහත් ලක්ෂ දාහත් දහසක (රු. 12,717,000) මුල් හිඟ මුදල මත 2019.08.20 වැනි දින සිට වර්ෂයකට 22% බැගින් පොලිය ;
2. 2019..08.19 වැනි දිනට අංක 444001000053719 දරන ණය පහසුකම් මත මුළු හිඟ මුදල වන ශ්‍රී ලංකා රුපියල් දහතුන් ලක්ෂයක (රු. 1,300,000) මුදල.

ඉහත කී ණය ශේෂයන් හෝ ඉන් යම් කොටසක් එකී බන්ධනදායී/උකස්කරු විසින් ගෙවා පියවා දැමීම පැහැර හැරීම සිදුකර ඇති බවට යූනියන් බැංකුව විසින් සෑහීමකට පත්වීමෙන් පසුව, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධානා) පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව යූනියන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලය ප්‍රකාරව ක්‍රියා කරමින්, ඉහත කී මූල්‍ය පහසුකම් මත බන්ධනදායී වෙතින් යූනියන් බැංකුව වෙත ලැබිය යුතු සහ අයවිය යුතු වන ශ්‍රී ලංකා රුපියල් එක්කෝටි හතළිස් දෙලක්ෂ අසූදහස් හාරසිය පනස් තුනකුත් ශත හතළිස් හතක (රු. 14,280,453.47) මුදලක් සහ ඉහත කී මූල්‍ය පහසුකම් නිසා මුල් හිඟ මුදල මත ඉහත කී අනුපාතයෙන් ඉහත දක්වා ඇති පරිදි 2019.08.20 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය තෙක් තවදුරටත් පොළිය සහ තව ද, එකී අංක 2111 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය, අංක 2297 දරන ද්විතීයික උකස් බැඳුම්කරය, අංක 3903 දරන තෘතීයික උකස් බැඳුම්කරය සහ අංක 4684 දරන සිව්වන උකස් බැඳුම්කරය සහ 1990 අංක 4 දරන එකී පනතේ 13 වන වගන්තිය යටතේ යූනියන් බැංකුව වෙත අයකර ගැනීමට හිමිකම් ඇති වෙනත් සියලුම මුදල් ප්‍රමාණයන් ද අයකර ගැනීම සඳහා එහි අංක 2111 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය අංක 2297 දරන ද්විතීයික උකස් බැඳුම්කරය, අංක 3903 දරන තෘතියික උකස් බැඳුම්කරය සහ අංක 4684 දරන සිව්වන උකස් බැඳුම්කරය ප්‍රකාරව සහ ඊට යටත්ව යූනියන් බැංකුවට උකසට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දැක්වෙන දේපළ ඉහත කී 1990 අංක 4 දරන පහත ප්‍රකාරව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට එල්. බී. සේනානායක ඔක්ෂනියර්ස් වෙත බලය පැවරීමට 1990 අංක 4 දරන එකී පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මෙයින් යෝජනා කරනු ලැබේ.

#### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොළොන්න කෝරළයේ, දියපොතගම් පත්තුවේ, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 213D දරන කෝන්කටුව ග්‍රාම නිලධාරි වසමේ උඩගම ගමේ පිහිටි කන්ඩම්බිගේ පංගුව නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ජී. ධර්මරත්න විසින් මැන සාදන ලද අංක 996 සහ 1996.07.27 වැනි දින දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කළ බිම් කොටසට මායිම්, උතුරට : ප්‍රවේශ මාර්ගය ද, නැගෙනහිරට : කේ. ඒ. සිරිසේන යන අය විසින් හිමිකම් කියන ඉඩම ද, දකුණට : අඹගහවෙල ද, බස්නාහිරට : ජුලීගාව වත්ත ද යන මෙකී මායිම් තුළ පිහිටි අක්කර තුනකුත් රූඩ් දෙකයි පර්චස් විසි හතරයි දශම හතක් (අ. 3, රූ. 2, පර්. 24.7) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි තරවුරු ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේත් සමග සහ එකී අංක 996 දරන පිඹුරේ නිරූපිත පාර මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමගය. මෙම දේපළ ඇඹිලිපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L 21/86 දරන වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කරන

ලදුව වර්තමානය වන විට ඇඹිලිපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L 21/102, L 21/104 සහ L 21/110 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

ඉනෝකා ජයවර්ධන
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

12 - 470

---

## සෙලාන් බැංකුව පී.එල්.සී. - කටුනායක ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව.

ගිණුම් අංකය : 0310-35394820-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019.11.25 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත.) ප්‍රසිද්ධ නොතාරිස් අයි. ටී. ගුණතිලක විසින් සියල්ල සහතික කරන ලද දෙකක් 2015 නොවැම්බර් මස 12 වැනි දිනැති උකස් බැඳුම්කර අංක 2793 සහ 2794, දෙකක් 2016 මාර්තු මස 31 දිනැති 2891 සහ 2892 මත අයවිය යුතු මුදල් ගෙවීම, රාජගිරිය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති සහ ලියාපදිංචි අංක පීවී 75925 දරන 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන ෆෙයාර්වේ හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදායී/උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර මත පහත සඳහන් පරිදි පහසුකම් මත 2019 අගෝස්තු මස 28 වැනි දින වන විට මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් නවකෝටි පනස් තුන් ලක්ෂ විසි තුන්දහස් තුන්සිය අසූ නවයයි ශත තිස් හතක (රු. 95,323,389.37) ක මුළු මුදලක් සෙලාන් බැංකුව පීඑල්සී වෙත දත් ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් එකී මුදල වන රුපියල් නවකෝටි පනස් තුන් ලක්ෂ විසිතුන් දහස් තුන්සිය අසූ නවයයි ශත තිස් හතක (රු. 95,323,389.37) 2019 අගෝස්තු මස 29 වැනි දින සිට මුළු මුදල අය කර ගන්නා දිනය දක්වා පහත සඳහන් පරිදි පොලිය සමඟ ප්‍රසිද්ධ කිරීමේ වියදම්, එකී පනතේ 13 වෙනි වගන්තිය යටතේ යම්කිසි වෙනත් ගාස්තු, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස එකී බැඳුම්කර අංක 2793, 2794, 2891 සහ 2892 මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තා වූ මෙහි සඳහන් උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රයන් බලයලත් වෙන්දේසිකාර චන්දිමා ගමගේ මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන, සංශෝධිත පරිදි, බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

(අ) කාලීන ණය I පහසුකම සම්බන්ධයෙන් රුපියල් හත්කෝටි තිස් තුන් ලක්ෂ හතලිස් නව දහස් හතලිස් හතයි ශත විසි එකක (රු. 73,349,047.21) මුදලක් සහ රුපියල් හයකෝටි අසූ හතර ලක්ෂයක (රු. 68,400,000.00) මුදලක් මත 2019 අගෝස්තු 29 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා වසරකට සියයට දහසයයි දශම තුනයි හත (16.37%) බැගින් පොලිය සමඟ.

(ආ) කාලීන ණය III පහසුකම සම්බන්ධයෙන් රුපියල් දෙකෝටි දහනව ලක්ෂ හැත්තෑ හතර දහස් තුන්සිය හතලිස් දෙකයි ශත දහසයක (රු. 21,974,342.16) මුදලක් සහ රුපියල් දෙකෝටි හාරලක්ෂ හැත්තෑ පන්දහසක (රු.20,475,000.00) මුදලක් මත 2019 අගෝස්තු මස 29 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා වසරකට සියයට දහසයයි දශම තුනයි හත (16.37%) බැගින් පොලිය සමඟ.

### පළමු උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර මහ නගර සභා සීමාව තුළ ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ දෙවට, අංක 100ඒ ග්‍රාම සේවක කොට්ඨාසය තුළ දෙවට පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. එන්. ඩබ්ලිව්. ලියනගේ විසින් සාදන ලද 2015 ඔක්තෝබර් මස 05 දිනැති අංක 4805 දරන සැලැස්මේ නිරූපනය වන අකුරැස්ස පාර වරිපනම් අංක 68 සහ 72 දරන මහන්තාගොඩවත්ත සහ ත්‍රිකෝන්මුල්ලේ දෙනියවත්ත නැමති ඉඩමේ ලොට් 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට: ගාල්ල සිට ඉමදූවට යන මහ පාර සහ මෙම ඉඩමේ මහන්තාගොඩවත්ත ද, නැගෙනහිරට : ලුණුවිල ඇල ද, දකුණට : මහන්තාගොඩවත්ත සහ බස්නාහිරට : මහන්තාගොඩවත්ත සහ හේනේවත්ත ද යන මායිම් තුළ අක්කර තුනයි රූඩ් දෙකයි පර්චස් විස්සයි දශම බිංදුවයි හතරක් (අ. 3, රූ. 2, පර්. 20.04) විශාල එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

ප්‍රසිද්ධ නොතාරිස් අයි. ටී. ගුණතිලක විසින් දෙකම සහතික කරන ලද දෙකම 2015 නොවැම්බර් මස 12 දිනැති උකස් බැඳුම්කර අංක 2793 සහ 2794 යටතේ උකස් කරන ලද දේපල.

### දෙවන උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර මහ නගර සභා සීමාව

තුළ ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ කටුගොඩ, අංක 100 ග්‍රාමසේවක කොට්ඨාසය තුළ කටුගොඩ ගාලුපියද්ද හෙවත් කටුගොඩ පිහිටි (කලින් දෙවට) බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද 2014 නොවැම්බර් මස 14 වැනි දිනැති අංක 13783 දරන සැලැස්මේ නිරූපනය වන ශ්‍රී විජිතාරාම පාර වරිපනම් අංක 03 දරන මහත්තගොඩවත්ත හෙවත් හේනවත්ත නැමති ඉඩමේ ලොට් 1 ලකුණු කළ (බලයලත් මිනින්දෝරු අජිත් ආර්. වීරසූරිය විසින් සාදන ලද 1995 අගෝස්තු මස 11 දිනැති අංක 907 සැලැස්මේ සඳහන් ලොට් එක්ස් 2 හි නැවත මැනීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරටː පාර (අංක 907 සැලැස්මේ සඳහන් ලොට් එක්ස් 4), ශ්‍රී විජිතාරාම පාර වරිපනම් අංක 1 දරන පරිශ්‍රය, අංක 13782 සැලැස්මේ සඳහන් ලොට් ඒ සහ අංක 13360ඒ සැලැස්මේ සඳහන් ලොට් 2 ද, නැගෙනහිරට : අංක 13782 සැලැස්මේ සඳහන් ලොට් ඒ, මෙහි සඳහන් ලොට් 2, බෙලිගහකොරටුව හෙවත් සියඹලාගහවත්ත සහ පාර ද, දකුණට : බෙලිගහකොරටුව හෙවත් සියඹලාගහවත්ත සහ පාර සහ බස්නාහිරට : විජිතාරාම පාර, පාර (අංක 907 සැලැස්මේ සඳහන් ලොට් එක්ස් 4) සහ ශ්‍රී විජිතාරාම පාර වරිපනම් අංක 1 දරන පරිශ්‍රය ද, යන මායිම තුළ රූඩ් දෙකයි පර්චස් විසි අටයි දශම හතරයි බිංදුවක් (අ. 0, රූ. 2, පර්. 28.40) විශාල ඉඩම.

මෙය පහත විස්තර කරනු ලබන පරිදි ඉඩමේ නැවත මැන අතුරු බෙදූ කොටසක් වේ.

පෙරකී කටුගොඩ පිහිටි බලයලත් මිනින්දෝරු අජිත් ආර්. වීරසූරිය විසින් සාදන ලද 1995 අගෝස්තු මස 14 වැනි දිනැති අංක 907 සැලැස්මේ නිරූපනය වන මාහත්තගොඩවත්ත නැමති ඉඩමේ ලොට්ස් එක්ස් 2 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් එක්ස් 1 සහ මාහත්ගොඩවත්තේ කැබැල්ල ද, නැගෙනහිරට : මාහන්තගොඩවත්තේ කොටස ද, දකුණට : පාර සහ බස්නාහිරට : ලොට් එක්ස් 4 සහ විජිතාරාම පාර ද යන මායිම් තුළ රූඩ් දෙකයි පර්චස් තිස්හතයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 2, පර්. 37.25) විශාල එහි පිහිටි වෙනත් සියලු දේ සමඟ ඉඩම.

පහත විස්තර කරනු ලබන ඉඩම් තුළ උඩින් සහ දිගේ මාර්ග අයිතිය සමඟ,

පෙරකී කටුගොඩ පිහිටි බලයලත් මිනින්දෝරු අජිත් ආර්. වීරසූරිය විසින් සාදන ලද 1995 අගෝස්තු මස 11 දිනැති අංක 907 සැලැස්මේ නිරූපනය වන මාහත්තගොඩවත්ත නමැති ඉඩමේ ලොට්ස් එක්ස් 4 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් එක්ස් 1 ද, නැගෙනහිරට : ලොට්ස් එක්ස් 2 ද, දකුණට : ලොට් එක්ස් 2 ද,සහ බස්නාහිරට : නාඹකුඹුර සහ විජිතාරාම පාර ද, යන මායිම් තුළ පර්චස් තුනයි දශම තුනයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 3.30) විශාල එහි පිහිටි වෙනත් සියලු දේ සමඟ ඉඩම.

2. දකුණු පළාතේ, ගාල්ල ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර තුළ ගාල්ල මහ නගර සභා සීමාව තුළ ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ දෙවට අංක 100ඒ, ග්‍රාම සේවක කොට්ඨාසය තුළ ගාලුපියද්ද හෙවත් කටුගොඩ පිහිටි (කලින් දෙවට) පිහිටි බලයලත් මිනින්දෝරු සාලිය වික්‍රමසිංහ විසින් සාදන ලද 2014 නොවැම්බර් මස 14 දිනැති අංක 13783 දරන සැලැස්මේ නිරූපනය වන මාහත්තගොඩවත්ත හෙවත් හේනවත්ත නමැති ඉඩමේ ලොට් 2 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද අංක 13782 සැලැස්මේ සඳහන් ලොට් ඒ ද, නැගෙනහිරට : වග්ගල්මෝදර ඇල සහ බෙලිගහකොරටුව හෙවත් සියඹලාගහවත්ත ද, දකුණට : සියඹලාගහවත්ත, ශ්‍රී විජිතාරාම පාර වරිපනම් අංක 15/18 දරන පරිශ්‍රය සහ බෙලිගහකොරටුව හෙවත් සියඹලාගහවත්ත සහ බස්නාහිරට : බෙලිගහකොරටුව හෙවත් සියඹලාගහවත්ත සහ ලොට් 1 ද යන මායිම් තුළ රූඩ් එකයි පර්චස් තිස්හයයි දශම එකයි බිංදුවක් (අ. 0, රූ. 1, පර්. 36.10) විශාල, එහි පිහිටි සියලු දේ සමඟ ඉඩම.

ප්‍රසිද්ධ නොතාරිස් අයි. ටී. ගුණතිලක විසින් දෙකම සහතික කරන ලද දෙකම 2016 මාර්තු මස 31 දිනැති උකස් බැඳුම්කර අංක 2891 සහ 2892 යටතේ උකස් කරන ලද දේපල.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

වී. ඒ. පරණගම මිය.
නීතිඥ නීති ප්‍රධානී.

12 - 478

---

**සෙලාන් බැංකුව පී.එල්.සී. - අකුරැස්ස ශාඛාව**
**(2007 අංක 7 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව

ගිණුම් අංකය : 1000 - 35360696 - 001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2019.11.25 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ

ලියාපදිංචි කර ඇත.) ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඕ. එස්. විතානන්ද විසින් දෙකම සහතික කරන ලද 2015 ඔක්තෝබර් මස 20 දිනැති බැඳුම්කර අංක 1289 සහ 2016 මාර්තු මස 24 දිනැති අංක 1351 මත අයවිය යුතු මුදල් ගෙවීම, දෙදෙනාම මාතර පදිංචි කනංකේ ආචාරිගේ මධුශංක සහ හේවා මුහන්දිරම්ගේ ඩන්ස්ටන් දයාරත්න යන අය බන්ධදායීන් / උකස්කරුවන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර මත කාලීන ණය පහසුකම් සම්බන්ධයෙන් 2019 ඔක්තෝබර් මස 01 වැනි දින වන විට මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් දෙකෝටි හතලිස් හතර ලක්ෂ දාහතර දහස් දෙසිය හතයි ශත අනූ හයක (රු. 24,414,207.96) ක මුදලක් සහ රුපියල් දෙකෝටි තිස්තුන් ලක්ෂයක (රු. 23,300,000.00) මුදලක් මත 2019 ඔක්තෝබර් මස 02 වැනි දින සිට වසරකට සියයට විස්ස (20%) බැගින් පොළිය සමග සෙලාන් බැංකුව පීඑල්සී වෙත දන් ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් එකී මුදල වන රුපියල් දෙකෝටි හතලිස් හතර ලක්ෂ දාහතර දහස් දෙසිය හතයි ශත අනූ හයක (රු. 24,414,207.96) 2019 ඔක්තෝබර් මස 02 වැනි දින සිට මුළු මුදල අයකර ගන්නා දිනය දක්වා පෙරකී පරිදි පොළිය සමග, ප්‍රසිද්ධ කිරීමේ වියදම්, එකී පනතේ 13 වැනි වගන්තිය යටතේ යම්කිසි වෙනත් ගාස්තු, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස එකී බැඳුම්කර අංක 1289 සහ 1351 මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තා වූ මෙහි සඳහන් උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රයන් බලයලත් වෙන්දේසිකාර චන්දිමා ගමගේ මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන, සංශෝධිත පරිදි, බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### පළමු උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර තුළ සහ මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ මහ නගර සභා සීමාව තුළ හිත්තැටිය නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ හිත්තැටිය ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු සී. එස්. ජයවර්ධන විසින් සාදන ලද 2010 ජුනි මස 18 වැනි දිනැති අංක 2010/86 සැලැස්මේ නිරූපනය වන මුදලින් ද පාර වරිපනම් අංක 70/51 සහ 70/50 දරන ගොඩකදුරුගහවත්තේ ලොට් ඒ හි යාබද ලොට්ස් 1 සහ 2 හි යාබද ලොට්ස් ඒ, බී සහ සී නැමති, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් එක්ස් ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී අංක 2010/86 සැලැස්මේ සඳහන් ලොට්ස් වයි සහ ඉසෙඩ් (අඩි 10ක් පළල පාර) ද, නැගෙනහිරට : මාදනගේවත්ත ද, දකුණට : හේන සහ බස්නාහිරට : මෙම ඉඩමේ බෙදන ලද ලොට්ස් බී සහ ඩී ද යන මායිම් තුළ පර්චස් විසි එකයි දශම තුනයි පහක් (අ. 0, රූ. 0, පර්. 21.35) විශාල ඉඩම.

පහත සඳහන් ඉඩම උඩින් මාර්ග අයිතිය සමග.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත්සතර තුළ සහ මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ මහ නගර සභා සීමාව තුළ හිත්තැටිය නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ හිත්තැටිය ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු සී. එස්. ජයවර්ධන විසින් සාදන ලද 2010 ජුනි මස 18 වැනි දිනැති අංක 2010/86 සැලැස්මේ නිරූපනය වන මුදලින් ද පාර වරිපනම් අංක 70/51 සහ 70/50 දරන ගොඩකදුරුගහවත්තේ ලොට් ඒ හි යාබද ලොට්ස් 1 සහ 2 හි යාබද ලොට්ස් ඒ, බී සහ සී නැමති, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් ඉසෙඩ් (පාර) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : බතලගොඩට යන පාර ද, නැගෙනහිරට : මාදනගේවත්ත ද, දකුණට : එකී අංක 2010/86 සැලැස්මේ සඳහන් ලොට් එක්ස් සහ බස්නාහිරට : එකී අංක 2010/86 සැලැස්මේ සඳහන් ලොට් වයි ද යන මායිම් තුළ පර්චස් හතරයි දශම හතයි හතරක් (අ. 0, රූ. 0, පර්. 4.74) විශාල ඉඩම.

ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඕ. එස්. විතානන්ද විසින් සහතික කරන ලද 2015 ඔක්තෝබර් මස 20 දිනැති උකස් බැඳුම්කර අංක 1289 යටතේ උකස් කරන ලද දේපළ.

### දෙවන උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ හිනිදුම පත්තුවේ, උතුර ආදායම් කොට්ඨාසය තුළ නෙළුව ප්‍රාදේශීය ලේකම් සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ (කලින් හිනිදුම උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ) පහල ගිගුම් මඩුව ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ ගිගුම් මඩුව ගමේ පිහිටි අංක 482 දරන මිනුම්පති ගේ සැලැස්මේ නිරූපනය වන කැවුම් කුඹුරුහේන නැමති, ගස්, වගා, ගොඩනැගිලි, සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමඟ ඉඩමේ ලොට් 183 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 172 (ආර්8351) ද, නැගෙනහිරට : ලොට් 184 ද, දකුණට : ලොට් 142 සහ බස්නාහිරට : ලොට් 142 ද යන මායිම් තුළ අක්කර දහයයි, පර්චස් දහසයක් (අ. 10, රූ. 0, පර්. 16) විශාල ඉඩම.

එකී අංක 1421 සැලැස්මේ සඳහන් ලොට් බී (ප්‍රාදේශීය සභා පාර) සහ එෆ්වීපී 482 හි සඳහන් ලොට් 184 (තවලම සිට නෙළුව ට යන පාර) තුළ උඩින් සහ දිගේ මාර්ග අයිතිය සමග.

ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඕ. එස්. විතානන්ද විසින් සහතික කරන ලද 2016 මාර්තු මස 24 දිනැති උකස් බැඳුම්කර අංක 1351 යටතේ උකස් කරන ලද දේපළ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

වී. ඒ. පරණගම මිය.
නීතිඥ නීති ප්‍රධානී.

12 - 480

### සෙලාන් බැංකුව පීඑල්සී - මහරගම ශාඛාව (2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 09 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව.

ගිණුම් අංකය : 0040-32557489-101.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2019.11.25 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත.) ප්‍රසිද්ධ නොතාරිස් පී. ඒ. සී. පෙරේරා විසින් සියල්ල සහතික කරන ලද 2014 නොවැම්බර් මස 13 වැනි දිනැති බැඳුම්කර අංක 1236, 2015 ජූලි මස 15 දිනැති 1359, 2015 දෙසැම්බර් මස 28 දිනැති 1472, 2016 දෙසැම්බර් මස 05 වැනි දිනැති 1616 සහ ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඩී. ඩී. ජේ. ප්‍රේමරත්න විසින් සහතික කරන ලද 2018 මාර්තු මස 19 වැනි දිනැති අංක 207 මත අයවිය යුතු මුදල් ගෙවීම, මහරගම පදිංචි තංගවේලු සුරේෂ් යන අය බද්ධදායී/ උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර මත කාලීන ණය පහසුකම සම්බන්ධයෙන් 2019 සැප්තැම්බර් මස 10 වැනි දින වන විට මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් අනූ තුන් ලක්ෂ තිස් අට දහස් අටසිය අනූ තුනයි ශත දහහතරක (රු. 9,338,893.14) ක මුදලක් සහ රුපියල් අසූහයලක්ෂයක (රු. 8,600,000.00) මුදලක් මත 2019 සැප්තැම්බර් මස 11 වැනි දින සිට වසරකට සියයට විස්ස (20%) බැගින් පොළිය සමග සෙලාන් බැංකුව පීඑල්සී වෙත දැන් ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් එකී මුදල වන රුපියල් අනූ තුන් ලක්ෂ තිස් අට දහස් අටසිය අනූතුනයි ශත දහහතරක (රු. 9,338,893.14) ක් 2019 සැප්තැම්බර් මස 11 වැනි දින සිට මුළු මුදල අයකර ගන්නා දිනය දක්වා පෙරකී පරිදි පොළිය සමග, ප්‍රසිද්ධ කිරීමේ වියදම්, එකී පනතේ 13 වැනි වගන්තිය යටතේ යම්කිසි වෙනත් ගාස්තු, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස එකී උකස් බැඳුම්කර අංක 1236, 1359, 1472, 1616 සහ 207 මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තා වූ මෙහි සඳහන් උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රයන් බලයලත් වෙන්දේසිකාර චන්ද්‍රිමා ගමගේ මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන, සංශෝධිත පරිදි, බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පලාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ මහරගම නගර සභා ප්‍රාදේශීය බල සීමාව තුළ ගොඩිගමුව දකුණ අංක 532ඒ ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ ගොඩිගමුව ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඒ. ප්‍රනාන්දු විසින් සාදන ලද 2014 ජූලි මස 12 දිනැති අංක 640 සැලැස්මේ නිරූපනය වන නීලම්මහර පාර, පරිපනම් අංක 209/2 දරන අඹගහවත්ත නැමති ඉඩමේ ලොට් 01 (බලයලත් මිනින්දෝරු පී. පී. අබේනායක විසින් සාදන ලද 1995 සැප්තැම්බර් මස 16 දිනැති අංක 2053 සැලැස්මේ නිරූපනය වන ලොට් 3 හි නැවත මැනීමක් වන) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : නීලම්මහර පාර අංක 456/1 දරන පරිශ්‍රය ද, නැගෙනහිරට : නීලම්මහර පාර අංක 454, 205 සහ 201/6 දරන පරිශ්‍රයන් ද, දකුණට : නීලම්මහර පාර අංක 459 දරන පරිශ්‍රය සහ බස්නාහිරට : පාර ද යන මායිම් තුළ පර්චස් අටක් (අ. 0, රූ. 0, පර්. 8) නොහොත් හෙක්ටයාර 0.0202 විශාල, ගොඩනැගිල්ල, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

පහත සඳහන් ඉඩම උඩින් හා දිගේ මාර්ග අයිතිය සමග.

බස්නාහිර පලාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ මහරගම නගර සභා ප්‍රාදේශීය බල සීමාව තුළ ගොඩිගමුව දකුණ අංක 532ඒ ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ ගොඩිගමුව ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. ඩබ්ලිව්. අබේසිංහ විසින් සාදන ලද 1992 ජුනි 05 වැනි දිනැති අංක 4151 සැලැස්මේ නිරූපනය වන නීලම්මහර පාර, වරිපනම් අංක 209/2 දරන අඹගහවත්ත නැමති ඉඩමේ ලොට් 1ඩී ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : නීලම්මහර පාර ද, නැගෙනහිරට : ලොට් 2ඒ ද, දකුණට : ලොට් 1සී සහ බස්නාහිරට : ලොට් 1බී සහ ලොට් 1ඒ ද යන මායිම් තුළ පර්චස් තුනයි දශම හතක් (අ. 0, රූ. 0, පර්. 3.7) විශාල ඉඩම.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

වී. ඒ. පරණගම මිය.
නීති ප්‍රධානී.

12 - 479

---

### සෙලාන් බැංකුව පීඑල්සී - මඩකලපුව ශාඛාව (2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 09 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව.

ගිණුම් අංකය : 0730-12810671-101.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019.11.25 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත.) ප්‍රසිද්ධ නොතාරිස් ඒ. සුදර්ශන් විසින් සහතික කරන ලද 2018 ඔක්තෝබර් මස 29 දිනැති බැඳුම්කර අංක 732 මත අයවිය යුතු මුදල් ගෙවීම, සියල්ලෝම මඩකලපුව පදිංචි සන්තෝසම් පුන්නියමූර්ති, පුන්නියමූර්ති සනූෂා හෙවත් සනූෂා පුන්නියමූර්ති, තංගරාසා බහිධරන් සහ චන්ද්‍රකලා බහිධරන් යන අය බන්ධදායීන්/ උකස්කරුවන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය මත කාලීන ණය පහසුකම සම්බන්ධයෙන් 2019 ජූලි මස 25 වැනි දින වන විට මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් හැට හත්ලක්ෂ හැටපන්දහස් පන්සීය පහලොවයි ශත අනූවක (රු. 6,765,515.90) ක මුදලක් සහ රුපියල් හැට හතර ලක්ෂ අනූ අට දාහක (රු.6,498,000.00) මුදලක් මත 2019 ජූලි මස 26 වැනි දින සිට වසරකට සියයට දහ නවය (19%) බැගින් පොළිය සමග සෙලාන් බැංකුව පීඑල්සී වෙත දුන් ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් එකී මුදල වන රුපියල් හැට හත් ලක්ෂ හැටපන්දහස් පන්සිය පහලොවයි ශත අනූවක (රු. 6,765,515.90) ක් 2019 ජූලි මස 26 වැනි දින සිට මුළු මුදල අයකර ගන්නා දිනය දක්වා පෙරකී පරිදි පොළිය සමග, ප්‍රසිද්ධ කිරීමේ වියදම්, එකී පනතේ 13 වෙනි වගන්තිය යටතේ යම්කිසි වෙනත් ගාස්තු, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස එකී බැඳුම්කර අංක 732 මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තා වූ මෙහි සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රයන් බලයලත් වෙන්දේසිකාර චන්දිමා ගමගේ මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන, සංශෝධිත පරිදි, බැංකු මගින් ප්‍රධානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, සහ මහ නගර සභාව තුළ සහ මන්මුනෙයි උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සහ 179සී පුලියන්තිවු දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ මඩකලපුව වෝඩ් අංක 04 පුලියන්තිවු ගමේ බලයලත් මිනින්දෝරු ඒ. සිංගරාසා විසින් සාදන ලද 2017 ජූලි මස 20 දිනැති අංක ඒඑස්/2017/190 සැලැස්මේ නිරූපනය වන නල්ලයියා පාර පිහිටි වරිපනම් අංක 11 දරන පරිශ්‍රයෙහි සිරප්පු තෝට්ටම් නැමති ලොට් 1 ලෙස පෙන්නුම් කරනු ලබන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : නල්ලයියා පාර සහ පුන්නියමූර්ති සහ බිරිඳගේ ඉඩම ද, නැගෙනහිරට : ප්‍රවේශය ද, දකුණට : ඊ. සිවපාක්කදෙවිගේ ඉඩම සහ බස්නාහිරට : පුන්නියමූර්ති සහ ආර්. පාක්කියරාසාගේ ඉඩම ද යන මායිම් තුළ පර්චස් එකොලහක් (අ. 0, රූ. 0, පර්. 11) විශාල, එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

වී. ඒ. පරණගම මිය.
නීති ප්‍රධානී.

12 - 481

---

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2019.10.30 වැනි දින පවත්වන ලද රැස්වීමේදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. කේ. එස්. එම්. රත්නායක මහතා විසින් සහතික කරන ලද 2011.01.21 දිනැති අංක 1908 දරන උකස් බැඳුම්කරය, 2012.01.12 දිනැති අංක 2262 දරන උකස් බැඳුම්කරය, 2014.09.25 දිනැති අංක 3161 දරන උකස් බැඳුම්කරය, 2014.02.19 දිනැති අංක 2882 දරන උකස් බැඳුම්කරය සහ 2016.04.22 දිනැති අංක 3948 දරන උකස් බැඳුම්කරය, මත ලබාදෙන ලද ණය පහසුකම් මත 2019.09.30 වැනි දින තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් ණය පහසුකම් 1 මත රු. 5,771,126.10 ක මුදලක්, ණය පහසුකම 2 මත රු. 6,918,324.43 ක මුදලක්, ණය පහසුකම 3 මත රු. 30,694,278.23 ක මුදලක් සහ ණය පහසුකම 4 මත රු. 1,798,716.24 ක මුදලක් සමඟ රු.4,375,000.00 ක ණය පහසුකම 1 හි හිඟ හිටි මුල් මුදල මත වසරකට සියයට 11.94% බැගින් 2019.10.01 වැනි දින සිට ගෙවීමේ නිමා කරන දිනය තෙක් තවදුරටත් පොළිය රු. 5,000.000.00 ක ණය පහසුකම 2 හි හිඟහිටි මුල් මුදල මත වසරකට සියයට 15.50% බැගින් 2019.10.01 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද රු. 22,300,000.00 ක ණය පහසුකම 3 හි හිඟ හිටි මුල් මුදල මත වසරකට සියයට 15.50% බැගින් 2019.10.01 වැනි දින සිට තවදුරටත් පොළිය ද රු. 1,300,000.00 ක ණය පහසුකම 4 හි හිඟ හිටි මුල් මුදල මත වසරකට සියයට 15.5% බැගින් 2019.10.01 වැනි දින සිට ගෙවීම නිමකරන දිනය තෙක් තවදුරටත් පොළිය ද, නිකවැරටිය,

හුලෝගෙදර පදිංචි වන්නිනායක මුදියන්සෙලාගේ උදාර සුපුන් කුමාර වන්නිනායක මහතා සහ වන්නිනායක මුදියන්සෙලාගේ හේරත් බංඩාගේ ජයසුන්දර හෙවත් වන්නිනායක මුදියන්සෙලාගේ ජයසුන්දර මහතා (සුපුන් රයිස් මිලිහි හවුල්කරුවන්) වෙතින් අයවිය යුතුව ඇත.

2. ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. කේ. එස්. එම්. රත්නායක මහතා විසින් සහතික කරන ලද 2011.01.21 දිනැති අංක 1908 දරන උකස් බැඳුම්කරය, 2012.01.12 දිනැති අංක 2262 දරන උකස් බැඳුම්කරය, 2014.09.25 දිනැති අංක 3161 දරන උකස් බැඳුම්කරය, 2014.02.19 දිනැති අංක 2882 දරන උකස් බැඳුම්කරය සහ 2016.04.22 දිනැති අංක 3948 දරන උකස් බැඳුම්කරය, මත ලබාදෙන ලද ණය පහසුකම් හතර මත අයවිය යුතු රු. 45,182,445.00 ක මුදල සමඟ 2019.10.01 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද ලංකා බැංකුවේ ආඥාපනතේ 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා ඉහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර එම්. එච්. ටී. කරුණාරත්න මහතාට ද එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, නිකවැරටිය ශාඛාවේ ප්‍රධාන කළමනාකරු හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

**ඉහත කී උපලේඛනය**

1. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වන්නිහත්පත්තුවේ මගුල් ඕතොට කෝරළේ, නිකවැරටිය ප්‍රාදේශීය සභා සීමාවේ, නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 321 හුලෝගෙදර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වහන්නැහැර ග්‍රාමයේ පිහිටි සීමා විස්තර කර ඇති රජයේ ඉඩම, උතුරට : ආර්. බී. වන්නිනායකගේ ඉඩම ද, නැගෙනහිරට : ඇත්දඬුව කුඹුර ද, දකුණට : ඩබ්. එම්. ගුණසේකරගේ ඉඩම ද, බස්නාහිරට : ගම්මායිම් පාර ද මායිම්ව අක්කර එකක (අ. 1, රූ. 0, පර්. 0) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති, වෙනත් සියලු දේත් වේ. මෙය නිකවැරටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO/Nika/Nika/77/192 හි ලියාපදිංචි කර ඇත.

එකී වහන්නැහැර ග්‍රාමයේ පිහිටි, බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. සිරිසේන විසින් සාදන ලද 2005.07.27 දිනැති අංක 6608 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස නිරූපිත, දැන් අඬ්ඩාඩුව කැලේ, නැමති එකී ඉඩම, උතුරට : ආර්. බී. වන්නිනායක හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට : ඇත්දඬුව කුඹුර ද, දකුණට : ඩබ්. එම්. ගුණසේකර හිමිකම් කියන ඉඩම ද, බස්නාහිරට : ප්‍රධාන පාරේ සිට නිවෙස් දක්වා පාර ද මායිම්ව අක්කර එකක (අ. 1, රූ. 0, පර්. 0) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති, වෙනත් සියලු දේත් වේ.

2. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වන්නිහත්පත්තුවේ මගුල් ඕතොට කෝරළේ, නිකවැරටිය ප්‍රාදේශීය සභා සීමාවේ, නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 321 හුලෝගෙදර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වහන්නැහැර ග්‍රාමයේ පිහිටි සීමා විස්තර කර ඇති, රජයේ ඉඩම, උතුරට : ජයසුන්දරගේ ඉඩම ද, නැගෙනහිරට : ඇද්දඩු වෙල ද, දකුණට : ආර්. බී. හේමපාලගේ ඉඩම ද, බස්නාහිරට : මාවතවැව සිට පාර ද මායිම්ව රූඩ් දෙකක (අ. 0, රූ. 2, පර්. 0) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති, වෙනත් සියලු දේත් වේ. මෙය නිකවැරටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO/Nika/Nika/88/33හි ලියාපදිංචි කර ඇත.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වන්නිහත්පත්තුවේ මගුල් ඕතොට කෝරළේ, නිකවැරටිය ප්‍රාදේශීය සභා සීමාවේ, නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 321 හුලෝගෙදර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වහන්නැහැර ග්‍රාමයේ පිහිටි, බලයලත් මිනින්දෝරු එස්. එම්. ආරියදාස විසින් සාදන ලද 2014.05.16 දිනැති අංක 14188 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස නිරූපිත දැන් "කපුයාය හේන" නැමති එකී ඉඩම, උතුරට : ජයසුන්දර හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට : ඇද්දඩු වෙල ද, දකුණට : ආර්. බී. හේමපාල හිමිකම් කියන ඉඩම ද, බස්නාහිරට : මහව පොරේ සිට වැව දක්වා පාර ද මායිම්ව රූඩ් දෙකක (අ. 0, රූ. 2, පර්. 0) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති, සියලු දේත් වේ.

ඉහත සඳහන් දෙවන උපලේඛනය

වෙන් කිරීම්

01. ඉඩම තුළ හෝ ඒ මත ඇති සියලු ඛණිජ (මෙම යෙදුමට මෙම ප්‍රදානයේ දී වටිනා ගල් ද ඇතුළත් වේ.) වල හිමිකම් සහ කැනීමට සෝදිසි කිරීමට, වැඩ කිරීමට හා එවන් ඛණිජ බැහැරට ගෙන යාමට ඇති අයිතිය රජය වෙත වෙන් කර තබා ඇත.

02. ඉඩමට අයිතිකරු වශයෙන් ඇති හිමිකම් මෙම ප්‍රදානය කරනු ලබන දිනයට ඉඩම මත පවතින මාරග අයිතිය හෝ ඉඩම මත ඇති අනෙකුත් පරවශ්‍යතාවන්ට යටත් වේ.

කොන්දේසි

01. අයිතිකරු විසින් ගොඩ ඉඩමෙන්/මඩ ඉඩමෙන් අක්කර-වශයෙන් මෙහි නම් කොට නිශ්චිතව දක්වා ඇති බිම් ප්‍රමාණයකටම වඩා අඩු උප බෙදීම් ඒකකයක් මෙම ඉඩමෙන් බැහැර නොකළ යුතුය.

02. අයිතිකරු විසින් මෙහි නම් කොට නිශ්චිතව දක්වා ඇති ඉඩම කොටසකට වඩා අඩු නොබෙදූ කොටසක් බැහැර නොකළ යුතුය.

03. කිසිවෙකුට ඉහත කොන්දේසි 1 හි නිශ්චිතව දක්වා ඇති උප බෙදීම් ඒකකයට වඩා ප්‍රමාණයෙන් අඩු බෙදෙන ලද කොටසක අයිතිකරුවකු විය නොහැක.

04. කිසිවෙකුට ඉහත කොන්දේසි 2 හි නිශ්චිතව දක්වා ඇති උප බෙදීම් ඒකකයකට වඩා ප්‍රමාණයෙන් අඩු බෙදන ලද කොටසක අයිතිකරුවෙකු විය නොහැක.

05. ඉඩමට හෝ එහි කිසියම් කොටසකට ජලය සැපයිය හැකි නම් හෝ දැනටමත් ඉදිකර ඇති යම් වාරිමාර්ග කාර්යයන් ඉදිකිරීමක් හෝ ඉදිකිරීමට ඇති යමක් හේතුවෙන් ජලය සැපයිය හැකි බවට පත්වන්නේ නම් හෝ එම ජලය සැපයිය හැකි ප්‍රාදේශීය සම්බන්ධයෙන් අයිතිකරු වාරිමාර්ග ආඥාපනතේ (453 වගන්තිය) ඇති ප්‍රතිපාදනවලට අනුකූලව කටයුතු කළ යුතුය.

06. දිසාපතිගෙන් ලිඛිත අවසරයක් සහ අදාළ අධිකාරිගෙන් බලපත්‍රයක් ලබා නොගෙන එම ඉඩම මත හෝ ඒ තුළ ඇති කිසිදු ඛනිජ ද්‍රව්‍යයන් හෑරීම, සෙවීම, භාවිතයට ගැනීම අයිතිකරු විසින් නොකළ යුතුය.

07. ප්‍රාදේශීය ලේකම්ගේ පූර්ව අනුමැතිය ලිඛිතව ලබා නොගෙන මෙම ඉඩම හෝ එහි ඕනෑම කොටසක් බැහැර නොකළ යුතුය

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ආර්. එම්. ඩී. ආර්. රත්නායක මයා,
කළමනාකරු.

ලංකා බැංකුව,
නිකවැරටිය ශාඛාව.

12 - 516

---

## යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව, යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින් මතු "යුනියන් බැංකුව" වශයෙන් හඳුන්වන) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019 නොවැම්බර් මස 01 වැනි දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, කුරුණෑගල මීගමුව පාර, අලුත් මල්කඩුවාව පදිංචි මංගල මුණසිංහ (ජාතික හැඳුනුම්පත් අංක 812783971V හිමි) (මෙහි මින්මතු "බන්ධනදායී" වශයෙන් හඳුන්වන) යන අය විසින් ශ්‍රී ලංකා රුපියල් අනූදෙලක්ෂයක (රු. 9,200,000.00) ණය මුදලක් (මෙහි මින්මතු "එකී ණය මුදල" වශයෙන් හඳුන්වන) ලබාගෙන ඇති බැවින් ද, එකී බන්ධදායී විසින් ශ්‍රී ලංකා රුපියල් අනූ දෙලක්ෂයක (රු. 9,200,000.00) මුදලක් සඳහා කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එල්. සී. ශාන්තා රැකව විසින් සහතික කරන ලද අංක 18600 සහ 2018.01.22 දිනැති මූලික උකස් බැඳුම්කරය ලියා අත්සන් කොට තබා, ඉහත කී මූල්‍ය පහසුකම් මත ලියාපදිංචි අංක PB676PQ දරන යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින්මතු "යුනියන් බැංකුව" වශයෙන් හඳුන්වන) වෙත අයවිය යුතු ඉහත කී මූල්‍ය පහසුකම් සහ ඒ මත පොලිය ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපල (අංක 18600 දරන ඉහත කී උකස් බැඳුම්කරයේ උපලේඛනයේ අංක 02 යටතේ සවිස්තරව දක්වා ඇති දේපළේ මාර්ග අයිතිය ද සමඟ) උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද,

ඒ අනුව, ඉහත කී මූල්‍ය පහසුකම් නිසා 2019.04.02 වැනි දිනට ශ්‍රී ලංකා රුපියල් අනූ පත් ලක්ෂ අනූ තුන් දහස් නවසිය හැත්තෑ එකකුත් ශත අනූ දෙකක (රු.9,593,971.92) මුදලක් සහ තව ද, මුල් හිඟ මුදල වන ශ්‍රී ලංකා රුපියල් අසූ නව ලක්ෂ හතළිස් නව දහස් අටසිය දාහතරකුත් ශත හැත්තෑ හතරක (රු. 8,949,814.74) මුදල මත 2019.04.03 වැනි දින සිට දේපල විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 21% බැගින් තවදුරටත් පොලියක් එකී බන්ධදායී වෙතින් යුනියන් බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති බැවින් ද,

ඉහත කී ණය ශේෂයන් හෝ ඉන් යම් කොටසක් එකී බන්ධදායී විසින් ගෙවා පියවා දැමීම පැහැර හැරීම සිදුකර ඇති බවට යුනියන් බැංකුව විසින් සෑහීමකට පත්වීමෙන් පසුව, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය ප්‍රකාරව යුනියන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලය ප්‍රකාරව ක්‍රියා කරමින්, ඉහත කී මූල්‍ය පහසුකම් මත 2019.04.02 වැනි දිනට මුළු හිඟ මුදල වන ශ්‍රී ලංකා රුපියල් අනූපත් ලක්ෂ අනූ තුන් දහස් නවසිය හැත්තෑ එකකුත් ශත අනූ දෙකක (රු. 9,593,971.92) මුදල සහ ඊට අමතරව මුල් හිඟ මුදල වන ශ්‍රී ලංකා රුපියල් අසූනව ලක්ෂ හතළිස් නව දහස් අටසිය දාහතරකුත් ශත හැත්තෑ හතරක (රු.8,949,814.74) මුදල මත 2019.04.03 වැනි දින සිට දේපල විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 21% බැගින් තවදුරටත් පොලිය සහ තව ද, එකී අංක 18600 දරන ඉහත කී බැඳුම්කරය සහ 1990 අංක 4 දරන එකී පනතේ 13 වැනි වගන්තිය යටතේ යුනියන් බැංකුව වෙත අයකර ගැනීමට හිමිකම් ඇති වෙනත් සියලු ම මුදල් ප්‍රමාණයන් ද අයකර ගැනීම සඳහා කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එල්. සී. ශාන්තා රැකව විසින් සහතික කරන ලද අංක 18600සහ 2018.01.22 වැනි

දිනැති මූලික උකස් බැඳුම්කරය ප්‍රකාරව සහ ඊට යටත්ව යුනියන් බැංකුව වෙත උකසට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වෙන නිශ්චල දේපළ (අංක 18600 දරන ඉහත කී උකස් බැඳුම්කරයේ උපලේඛනයේ අංක 2 යටතේ සවිස්තරව දක්වා ඇති දේපළේ මාර්ග අයිතිය ද සමඟ) ඉහත කී 1990 අංක 4 දරන පනත ප්‍රකාරව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට එල්. බී. සේනානායක ඔක්ෂනියර්ස් වෙත බලය පැවරීමට 1990 අංක 4 දරන එකී පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රැකොපත්තු කෝරළයේ දඹදෙනි හත්පත්තුවේ පොල්ගහවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උහුමීය ග්‍රාම නිලධාරි වසමේ උහුමීය ගමේ පිහිටි, "බෙරවාපිටියේ පිල්ලෑව සහ කෝන්ගහමුල වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. එම්. රත්නපාල විසින් මැන සාදන ලද අංක 3331 සහ 2017.10.05 දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 01 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටසට මායිම්, උතුරට : අංක 1481 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 02 ද, නැගෙනහිරට : අංක 483 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 02 ද, දකුණට : නාරම්මල-කුරුණෑගල ප්‍රධාන පාර ද, බස්නාහිරට : අංක 1481 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 04 (පාර) ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) විශාල බිම් කැබැල්ල වන අතර, මෙම දේපළ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ V/94/60 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ලොට් අංක 01 වනාහි බලයලත් මිනින්දෝරු ආර්. එම්. රත්නපාල විසින් මැන සාදන ලද අංක 1481 සහ 2002.08.03 වැනි දින පිඹුරේ නිරූපිත ලොට් අංක 03 හි නැවත මැන බෙදා වෙන් කිරීමක් වේ.

තවද, බලයලත් මිනින්දෝරු ආර්.එම්. රත්නපාල විසින් මැන සාදන ලද අංක 1481 සහ 2002.08.03 දින දරන පිඹුරේ නිරූපිත, කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එල්. සී. ශාන්තා රැකව විසින් සහතික කරන ලද අංක 18600 සහ 2018.01.22 දිනැති ඉහත කී උකස් බැඳුම්කරයේ උපලේඛනයේ අංක 02 යටතේ සවිස්තරව දක්වෙන, කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ V/94/61 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇති, ලොට් අංක 04 (පාර) වශයෙන් ලකුණු කරන ලද ඉඩමේ මාර්ග අයිතියද සමඟය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

ඉනෝකා ජයවර්ධන,
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

12 - 473

---

### සෙලාන් බැංකුව පීඑල්සී - මානිපායි ශාඛාව

2007 අංක 07 දරණ සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියා පදිංචි කර ඇත.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනගන්නා ලද යෝජනාව

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2019.11.25 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 4 දරණ බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 1310-12741453-001

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ජුඩේරාජ් අනෙට්වනි විසින් සහතික කරන ලද 2019 ජුනි මස 28 උකස් බැඳුම්කර අංක 343 මත අයවිය යුතු මුදල් ගෙවීම්, යාපනයේ සිය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති සහ අංක 13494 දරණ ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම යටතේ සුන්දශන් යන නාමය විලාශය සහ අභිධානය යටතේ හවුල් ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යනු ලබන සියල්ලෝම යාපනය පදිංචි සුන්දරම් සිවකුමාරන්, සිවකුමාරන් කමලාදේවි, සිවකුමාරන් ප්‍රතීබාන් සහ සිවකුමාරන් නිතර්සනන් යන අය බන්ධනදායීන්/උකස්කරුවන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය මත පහත සඳහන් පරිදි පහසුකම් මත 2019 සැප්තැම්බර් 25 දින වන විට මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් අටකෝටි තිස්හයලක්‍ෂ හැත්තෑහත්දහස් තුන්සිය හතයි ශත තිස්නවයක (රු. 8,36,77,307.39) මුළු මුදලක්, සෙලාන් බැංකුව පීඑල්සී වෙත හිඟව සහ අයවිය යුතුව ඇති හෙයින් එකී මුදල වන රුපියල් අටකෝටි තිස් හයලක්‍ෂ හැත්තෑහත්දහස් තුන්සිය හතයි ශත තිස්නවයක් (රු. 8,36,77,307.39) 2019 සැප්තැම්බර් මස 26 වැනි දින සිට මුළු මුදල අයකර ගන්නා දිනය දක්වා පහත සඳහන් පරිදි පොලිය සමග, ප්‍රසිද්ධ කිරීමේ වියදම් එකී පනතේ 13 වෙනි වගන්තිය යටතේ යම්කිසි වෙනත් ගාස්තු තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස එකී බැඳුම්කර අංක 343 මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කර ඇත්තාවූ මෙහි සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර චන්ද්‍රිමා ගමගේ මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරණ සංශෝධිත පරිදි බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

(අ) ස්ථිර අයිරා අණකර පහසුකම සම්බන්ධයෙන් රුපියල් තුන්කෝටි විසිතුන්ලක්ෂ හැත්තෑහතර දහස් හත්සිය දාහතයි ශත විසිනවයක (රු. 3,23,74,717.29) මුදලක් 2019 සැප්තැම්බර් මස 26 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා වසරකට සියයට විසිඅට (28%) බැගින් පොලිය සමග.

(ආ) ප්‍රතිව්‍යුහගත කාලීන ණය පහසුකම සම්බන්ධයෙන් රුපියල් පන්කෝටි දහතුන්ලක්ෂ දෙදහස් පන්සිය අනූවයි ශත දහයක (රු. 5,13,02,590.10) මුදලක් සහ රුපියල් හාරකෝටි අනූහත්ලක්ෂ විසිතුන්දහස් පන්සීයක (රු. 4,97,23,500.00) මුදලක් 2019 සැප්තැම්බර් මස 26 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා වසරකට සියයට විසිඑක (21%) බැගින් පොලිය සමග.

### උපලේඛනය

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කය තුළ දකුණු බටහිර වලිකාමම් ප්‍රාදේශීය සභා සීමාව තුළ සන්දිලිපායි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ මනිපායි උතුර-ජේ/137 ග්‍රාම නිලධාරීගේ කොට්ඨාශය තුළ මනිපායි ඉරායි, මනිපායි පත්තුවේ වලිකාමම් දකුණු බටහිර කොට්ඨාශයේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. අරුල්නේසන් විසින් සාදන ලද 2018 ජුනි මස 06 දිනැති අංක 1727බී සැලැස්මේ සඳහන් චන්ට්පනයියුම් චනිපනෙයි වලවුම් නමැති ඉඩමේ ලොට්ස් 2 සහ 3 ලකුණු කල ඉඩම් කොටසට මායිම්, නැගෙනහිරට : යාපනය - මනිපායි පාර ද, උතුරට : ජීවම්රුදම් ආරියරත්නම් සහ සිවකුමාරන් සහ භාර්යාව කමලදේවි ගේ දේපල සහ එකී අංක 1727 බී සැලැස්මේ සඳහන් ලොට් 1 ද, බස්නාහිරට : පටුමග සහ දකුණට : සිවකුමාරන් සහ භාර්යාව කමලදේවි සහ තර්මලිංගම් ගේ උරුමක්කරුවන්ගේ දේපළ ද යන මායිම් තුළ ලාච්චම් පහයි වරාගු කල්චර් සහ දහහතයි දශම බිංදුවයි තුනක් කුලීස් (5 එල්එම්එස් වී. සී. සහ 17.03 කේඑල්එස්) විශාල ඉඩම.

මෙය නිවස, ළිඳ වගා සහ බලයලත් මිනින්දෝරු ටී. තර්මලිංගම් විසින් සාදන ලද 2005 අගෝස්තු මස 18 දිනැති අංක 0001 සැලැස්මේ සඳහන් ලොට් 20 ලකුණු කල පාර උඩින් මාර්ග අයිතිය සහ එහි පිහිටි වෙනත් අදාළ අයිතීන් සමග.

ඉහත සඳහන් ඉඩම පහත විස්තර කරනු ලබන ඉඩමේ බෙදන ලද කොටසක් වේ.

උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කය තුළ දකුණු බටහිර වලිකාමම් ප්‍රාදේශීය සභා සීමාව තුළ සන්දිලිපායි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ මනිපායි උතුර-ජේ/137 ග්‍රාම නිලධාරීගේ කොට්ඨාශය තුළ මනිපායි ඉරායි, මනිපායි පත්තුවේ වලිකාමම් දකුණු බටහිර කොට්ඨාශයේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. අරුල්නේසන් විසින් සාදන ලද 2010 මැයි මස 14 දිනැති අංක 1727 සැලැස්මේ සඳහන් චන්ට්පනයියුම් චනිපනෙයි වලවුම් නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කල ඉඩම් කොටසට මායිම් නැගෙනහිරට : ප්‍රධාන පාර ද, උතුරට : ජීවම්රිදම් ආරියරත්නම් සහ සිවකුමාරන් සහ භාර්යාව කමලදේවි ගේ දේපළ ද, බස්නාහිරට : පටුමග සහ දකුණට : සිවකුමාරන් සහ භාර්යාව කමලදේවි සහ තරමලිංගම් ගේ උරුමක්කරුවන්ගේ දේපළ ද යන මායිම් තුළ ලාච්චම් හයයි වරාගු කල්චර් සහ දහහතරයි දශම දෙකයි එකක් කුලීස් (6 එල්එම්එස් වී. සී. සහ 14.21 කේඑල්එස්) විශාල ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

වී. ඒ. පරණගම (මිය),
නීතිඥ,
නීති ප්‍රධානී.

12 - 482

---

### සෙලාන් බැංකුව පීඑල්සී - තිස්සමහාරාම ශාඛාව

2007 අංක 07 දරණ සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියා පදිංචි කර ඇත.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනගන්නා ලද යෝජනාව

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019.11.25 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0370-35312750-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් පී. පී. පරනවිතාන විසින් දෙකම සහතික කරන ලද 2018 අප්‍රේල් 09 දිනැති බැඳුම්කර අංක 960 සහ 2018 අප්‍රේල් මස 10 දිනැති 965 මත අයවිය යුතු මුදල් ගෙවීම, අම්බලන්තොට පදිංචි විජේතුංග ලියන පටබැඳිගෙයි ප්‍රදීප් ශාන්ත කුමාර යන අය බන්ධනදායී/උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර මත ප්‍රතිව්‍යුහගත කාලීන ණය පහසුකම සම්බන්ධයෙන් 2019 ඔක්තෝබර් මස 29 වැනි දින වන විට මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් තුන්කෝටි තිස්පන්ලක්ෂ හැටතුන්දහස් පන්සියඅසූහතයි ශත හැත්තෑහයක (රු. 3,35,63,587.76) මුදලක් සහ රුපියල් තුන්කෝටි දෙලක්ෂ විසිපන්දාහක (රු. 3,02,25,000.00) මුදලක් මත 2019 ඔක්තෝබර් මස 30 වැනි දින සිට වසරකට සියයට දහනවයයි දශම පහ (19.5%) බැගින් පොලිය සමග සෙලාන් බැංකුව පීඑල්සී වෙත දැන් ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් එකී මුදල වන රුපියල් තුන්කෝටි තිස්පන්ලක්ෂ හැටතුන්දහස්

පන්සියඅසූහතයි ශත හැත්තෑහයක (රු.3,35,63,587.76) 2019 ඔක්තෝබර් මස 30 වැනි දින සිට මුළු මුදල අයකර ගන්නා දිනය දක්වා පෙරකී පරිදි පොලිය සමග, ප්‍රසිද්ධ කිරීමේ වියදම්, එකී පනතේ 13 වෙනි වගන්තිය යටතේ යම්කිසි වෙනත් ගාස්තු, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස එකී බැඳුම්කර අංකඃ 960 සහ 965 මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තා වූ මෙහි සඳහන් උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රයන් බලයලත් වෙන්දේසිකාර චන්දිමා ගමගේ මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරණ, සංශෝධිත පරිදි බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### පළමු උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත්සතර සහ මහ නගර සභා සීමාව සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ තුඩාව (උතුර) ග්‍රාම නිලධාරී කොට්ඨාශය තුළ දෙල්කඩ ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු යූ. ගුණවර්ධන විසින් සාදන ලද 1999 පෙබරවාරි 27 (වඩාත් නිවැරදිව 1999 මාර්තු මස 04 වැනි) දිනැති අංක 744 සැලැස්මේ නිරූපනය වන කුරුඳුවත්ත පාර දිගේ තෙවරකඩුගේවත්ත හෙවත් තෙවරවඩුගේවත්ත හෙවත් දෙල්කඩවත්ත ලොට් බී හි ලොට් බී3 නමැති ඉඩමේ ලොට් 2 ලකුණු කල බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට : මෙම ඉඩමේ ලොට් 01 ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් 3 ද, දකුණට : පිටදෙනිය සහ බස්නාහිරට : කුරුඳුවත්ත පාර ද යන මායිම් තුළ පර්චස් දහයයි දශම බිංදුවයි අටක් (අ. 0, රූ. 0, පර්. 10.08) නොහොත් හෙක්ටයාර 0.02549 ක් විශාල බිම, ගස්, වගා, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් ඉඩම බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඒ. ඒ. පත්මකුමාර විසින් සාදන ලද 2017 ඔක්තෝබර් මස 28 දිනැති අංක 766 දරන මැතක මිනුම් සැලැස්මක් අනුව ලොට් 2 ලෙස වැඩිදුරටත් නිරූපනය කර ඇති අතර එයට මායිම් උතුරට : මෙම ඉඩමේ ලොට් 01 ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් 3 ද, දකුණට : පිංදෙනිය සහ බස්නාහිරට : කුරුඳුවත්ත පාර ද යන මායිම් තුළ පර්චස් නවයයි දශම හතයිහතරක් (අ. 0, රූ. 0, පර්. 9.74) විශාල ඉඩම.

ප්‍රසිද්ධ නොතාරිස් පී. පී. පරණවිතාන විසින් සහතික කරන ලද 2018 අප්‍රේල් මස 03 දිනැති උකස් බැඳුම්කර අංක 960 යටතේ උකස් කරන ලද දේපළ.

### දෙවෙනි උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, නැගෙනහිර ගිරුවා පත්තුවේ, අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, අම්බලන්තොට ප්‍රාදේශීය සභා සීමාව තුළ බෝලාන උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාශය තුළ බෝලාන ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එල්. කේ. ගුණසේකර විසින් සාදන ලද 2005 ජූලි මස 06 දිනැති අංක 3830 සැලැස්මේ නිරූපනය වන ලොට් අංක බී දරණ බෙදා වෙන්කරන ලද රජයේ ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 3830 සැලැස්මේ සඳහන් ලොට් ඒ සහ ලොට් අංක 77 සහ එෆ්ටීපී 567 හි සඳහන් ලොට් අංක 78 ද, නැගෙනහිරට : ලොට් 77 සහ එෆ්ටීපී 567 හි සඳහන් ලොට් අංක 78 සහ අංක 3913 සැලැස්මේ සඳහන් ලොට් අංක 5 ද, දකුණට : පාර සහ අංක 3913 සැලැස්මේ සඳහන් ලොට් 5 සහ බස්නාහිරට : පාර සහ අංක 3830 සැලැස්මේ සඳහන් ලොට් ඒ ද යන මායිම් තුළ රූඩ් එකයි පර්චස් දහයක් (අ. 0, රූ. 1, පර්. 10) විශාල බිම, ගස්, වගා, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් ඉඩම බලයලත් මිනින්දෝරු එච්. එච්. ධර්මදාස විසින් සාදන ලද 2014 ඔක්තෝබර් මස 03 දිනැති අංක 4823 දරන මැතක මිනුම් සැලැස්මක ලොට් බී ලෙස වැඩිදුරටත් නිරූපනය කර ඇති අතර එයට මායිම් උතුරට : එෆ්ටීපී 567 හි සඳහන් ලොට් අංක 78 සහ ලොට් ඒ1 ද, නැගෙනහිරට : ලොට් 77 සහ එෆ්ටීපී 567 හි 78 සහ අංක 3913 සැලැස්මේ සඳහන් ලොට් 5 ද, දකුණට : අංක 3913 සැලැස්මේ සඳහන් ලොට් අංක 05 සහ පාර සහ බස්නාහිරට : පාර සහ ලොට් ඒ ද යන මායිම් තුළ රූඩ් එකයි පර්චස් දහයක් (අ. 0, රූ. 1, පර්. 10) විශාල ඉඩම.

ප්‍රසිද්ධ නොතාරිස් පී. පී. පරණවිතාන විසින් සහතික කරන ලද 2018 අප්‍රේල් මස10 දිනැති උකස් බැඳුම්කර අංකඃ 965 යටතේ උකස් කරන ලද දේපළ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

වී. ඒ. පරණගම (මිය),
නීතිඥ,
නීති ප්‍රධානී.

12 - 483

---

### මහජන බැංකුව - මැජෙස්ටික් සිටි ශාඛාව

### 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඇ වගන්තිය යටතේවූ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29(ඇ) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019.08.27 වැනි දින පවත්වන ලද ස්වකීය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත දක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරනු ලැබූ බව මෙයින් නිවේදනය කර සිටිනු ලැබේ.

මහජන බැංකුව වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එන්. පෙරේරා විසින් සහතික කරන ලද 2018.06.22 වැනි දින අංක 5598 දරන උකස් බැඳුම්කරය සහ 2016.02.14 දින අංක 5217 දරන උකස් බැඳුම්කරය මත ද, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. ලියනගේ විසින් සහතික කරන ලද 2018.02.02 දින අංක 7665 දරන බැඳුම්කරය, 2018.02.02 වැනි දින අංක 7663 දරන උකස් බැඳුම්කරය, 2018.02.02 වැනි දින අංක 7664 දරන උකස් බැඳුම්කරය යන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම (මෙහි මින්මතු "බන්ධනදායී" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන යෙදුම අනුව අප්පු හැන්නදි තොටහේවගේ ක්‍රිෂාන්ත ආරියපාල යන අය සහ පද සම්බන්ධය අනුව ඔහුගේ උරුමක්කරුවන්, පොල්මඃකරුවන්, අද්මිනිස්ත්‍රාසිකරුවන් යන පැවරුම්ලාභීන් අවශ්‍ය වන, පිළිගනු ලබන, අදහස් වන සහ ඇතුළත් වන) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 22, බුලර්ස් පටුමග, කොළඹ 05 යන ස්ථානයේ පදිංචි (අරලිය ට්‍රේඩ් සුපර් මාකට්හි පරම අයිතිකරු වන) අප්පු හැන්නදි තොටහේවගේ ක්‍රිෂාන්ත ආරියපාල යන අය විසින් පැහැරහැර ඇති හෙයින් ද, එකී උකස් බැඳුම්කර මත දනට මහජන බැංකුව වෙත රුපියල් මිලියන එකසිය විසිතුනයි අටලක්ෂ අසූ අටදහස් පන්සිය විසිපහයි ශත පනස් තුනක් වූ (රු.12,38,88,525.53) මුදලක් ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින හෙයින් ද,

අනතුරුව කිසියම් ගෙවීමක් (සිදුකර ඇත්නම්) එම ගෙවීම අඩුකිරීමෙන් පසුව විකුණුම් පිරිවැය සහ වෙනත් ගාස්තු ද සමඟ 2019.07.09 වැනි දින සිට වෙන්දේසි දිනය තෙක් ඉහත කී අංක 5598 දරන උකස් බැඳුම්කරය මත වර්ෂයකට 15% ක් වූ පොලී මුදලක් ද සමඟ රුපියල් මිලියන පනස් දෙකයි හාරලක්ෂ අනූඅටදහස් පනස්හතයි ශත අනූපහක් වූ (රු. 5,24,98,057.95) මුදලක් ද 2019.07.09 වැනි දින සිට වෙන්දේසි දිනය තෙක් ඉහත කී අංක 5217 දරන උකස් බැඳුම්කරය මත වර්ෂයකට 17% ක් වූ පොලී මුදලක් සමඟ රුපියල් මිලියන තිස්අටයි හාරලක්ෂ අනූහයදහස් හයසිය හැටහයයි ශත අසූවක් (රු. 384,96,666.80) වූ, මුදලක් ද 2019.07.09 වැනි දින සිට වෙන්දේසි දිනය තෙක් ඉහත කී අංක 7665 දරන උකස් බැඳුම්කරය මත වර්ෂයකට 19% ක් වූ පොලී මුදලක්ද සමඟ රුපියල් මිලියන හයයි එක් ලක්ෂ හත් දහස් නවසිය හතළිස් හතරයි ශත හතළිස් හයක් වූ (රු. 6,107,944.46) මුදලක් ද, 2019.07.09 වැනි දින සිට වෙන්දේසි දිනය තෙක් ඉහත කී අංක 7663 දරන උකස් බැඳුම්කරය මත වර්ෂයකට 20.5%ක් වූ පොලී මුදලක් ද සමඟ රුපියල් මිලියන දහයක් වූ (රු. 10,000,000.00) මුදලක් ද, 2019.07.09 වැනි දින සිට වෙන්දේසි දිනය තෙක් ඉහත කී අංක 7664 දරන උකස් බැඳුම්කරය මත වර්ෂයකට 28%ක් වූ පොලී මුදලක් ද සමඟ රුපියල් මිලියන දහසක් වූ (රු. 10,000,000.00) මුදලක් ද අයකර ගැනීම සඳහා ඉහත කී උකස් බැඳුම්කර මගින් ඉහත කී බැංකුව වෙත උකස් කරන ලද දේපළ සහ පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයයි 1986 අංක 32 දරණ පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කර සිටිනු ලැබේ.

**උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහනගර සභා සීමාව ඇතුළත තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, බම්බලපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාශය ඇතුළත හැව්ලොක්ටවුන්හි බම්බලපිටිය පාර සහ ද ෆොන්සේකා පෙදෙස යන ස්ථානයේ පිහිටා ඇත්තා වූ ද, ගාලු පාර වරිපනම් අංක 237 දරන සහ බලයලත් මිනින්දෝරු එන්. රාජෙන්ද්‍ර විසින් ලද 1964.08.14 වැනි දින අංක 2963 දරන පිඹුරේ "ලොට් අංක 1"ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද උතුරට : බම්බලපිටිය පාර වරිපනම් අංක 231 දරන පරිශ්‍රය ද, නැගෙනහිරට : එකී අංක 2963 පිඹුරේ ලොට් අංක 3 ද, දකුණට : එකී අංක 2963 දරණ පිඹුරේ ලොට් අංක 2 ද, බස්නාහිරට : බම්බලපිටිය පාර ද, යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ E141/133 දරන වෙලුම/පත්තිරුව යටතේ ලියාපදිංචි වී ඇත්තා වූ ද එකී අංක 2963 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් පහලවයි දශම එකයි බිංදුවක් වූ (අ. 0, රූ. 0, පර්. 15.10) ඉහත කී ලොට් අංක 1 දරන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ ඒ මත වූ ගහකොළ, ගොඩනැගිලි, වගාවන් සහ වෙනත් සියලු දේ ද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

ප්‍රාදේශීය කළමනාකරු,
කොළඹ දකුණ.

කලාප ප්‍රධාන කාර්යාලය - (බස්නාහිර කලාපය - 01)
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.

---

12 - 484

## සම්පත් බැංකුව පීඑල්සී
## (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

එම්. එම්. ශ්‍යාමලී සහ ඊ. එස්. තරංග.
ගිණුම් අංක : 1116 5759 8234.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2019.10.31 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් මාතර ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එස්. පරණමාන යන අය විසින් ලියා සහතික කරන ලද 2018 මැයි මස 02 සහ 03 දාතම හා අංක 4787 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට

තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදලිගේ මදූෂා ශ්‍යාමලී සහ එගොඩහේවගේ සුමුදු තරංග යන අය බන්ධනදායීන් වශයෙන් හා එකී මුදලිගේ මදූෂා ශ්‍යාමලී යන අය උකස්කරු වශයෙන්ද, පැහැර ඇති හෙයින්ද, එකී අංක 4787 දරන උකස් බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් පනස් තුන් ලක්ෂ හාර දහස් නමසිය දහ අටයි ශත හතරක (රු. 5,304,918.04) මුදලක් 2019 සැප්තැම්බර් මස 03 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රුපියල් පනස් තුන් ලක්ෂ හාර දහස් නමසිය දහ අටයි ශත හතරක (රු. 5,304,918.04) මුදලද, 2019 සැප්තැම්බර් මස 04 වැනි දින සිට අංක 4787 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පනස් ලක්ෂ හැත්තෑ තුන් දහස් තුන්සිය විසි හයයි ශත දහ හතරක (රු. 5,073,326.14) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) බැගින් වූ පොලියද, දැන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 4787 දරන එකී උකස් බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, දකුණ ගිරුව පත්තුවේ, තංගල්ල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, මොරකොල්ලිය ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ, මොරකොල්ලිය පිහිටි "අනුක්කන්වල යාය හි ලොට් 3හි උපබෙදුම" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. එච්. එම්. කේ. කරුණාරත්න යන අය විසින් සාදන ලද 2016 සැප්තැම්බර් මස 03 දාතම හා අංක 842 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් $3^{6}$ වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 12E පාර සඳහා වෙන්කිරීම සහ FVP අංක 318 හි පාර, අංක 2009/45 දරන පිඹුරේ ඉවත් කළ ලොට් 4 සහ මෙම ඉඩමේ ලොට් $3^{1}$, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් $3^{1}$, $3^{3}$, $3^{4}$, $3^{5}$ සහ අංක 0773 දරන පිඹුරේ ලොට් 4, 5, 6, 7, 8 සහ 9, දකුණට : අංක 0773 දරන පිඹුරේ ඉවත් කළ ලොට් 10 සහ තංගල්ල සිට බෙලිඅත්ත දක්වා ප්‍රධාන පාර සහ බස්නාහිරට : අංක 0773 දරන පිඹුරේ ලොට් 2 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකයි පර්චස් තිහයි දශම එකයි තුනක් (A:1, R:0, P:30.13) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 842 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව G 121/122 යටතේ තංගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

12 - 342/1

---

## සම්පත් බැංකුව පීඑල්සී
## (සීමාසහිත සම්පත් බැංකුව නමින් කළින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

බී. එස්. කුමාර
ගිණුම් අංක : 1180 5764 8375.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2019.10.31 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් මාතර ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එස්. පරණමාන යන අය විසින් ලියා සහතික කරන ලද 2018 ජුනි මස 18 දාතම හා අංක 4865 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට අපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බලමානගේ නොහොත් බලවනගේ සමන් කුමාර යන අය බන්ධනදායී වශයෙන් පැහැර ඇති හෙයින් ද, එකී අංක 4865 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හැත්තෑ හත් ලක්ෂ හැත්තෑ එක් දහස් හයසිය හැට තුනයි ශත අසූ හතක (රු. 7,771,663.87) මුදලක් 2019 ඔක්තෝබර් මස 01 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රුපියල් හැත්තෑ හත් ලක්ෂ හැත්තෑ එක් දහස් හයසිය හැට තුනයි ශත අසූ හතක (රු. 7,771,663.87) මුදලද, 2019 ඔක්තෝබර් මස 02 වැනි දින සිට අංක 4865 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හැත්තෑ පන් ලක්ෂ අසූ හතර දහස් දහ නමයයි ශත අසූ පහක (රු. 7,584,019.85) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ තුනයි

දශම පහක් (13.5%) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 4865 දරන එකී උකස් බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

1. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ග්‍රැවට් හතර සහ මහ නගර සහා සීමාවන් තුළ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, වල්ගම් - දකුණ (අංක 411 C) දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ, වල්ගම දකුණ පිහිටි "අමරතුංග වත්ත නොහොත් අමරතුංග වත්ත හි ලොට් 2 සහ අමරතුංග වත්ත, අමරතුංග වත්ත හි ලොට් B හි ලොට් 3, ගස්නාවයේ වත්ත හි ලොට් 1 නොහොත් කලුඅප්පුගේ වත්ත තංඩල්ගේ වත්ත හි ලොට් 1, 3 සහ 4, වෙදකැල්ල හි ලොට් 1, 3 සහ 5, සෙනවීරගේ කොරටුව හි ලොට් A සහ B යයි කියනු ලබන ඒකාබද්ධ ඉඩම්වල ලොට් X හි X1 හි උප බෙදුම" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. සමරසිංහ යන අය විසින් සාදන ලද 2018 ජනවාරි මස 23 දාතම හා අංක 2018/1319 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 40 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙහි ලොට් 39 සහ 26 (මීටර් 4.5 පළල පාර), නැගෙනහිරට : මෙහි ලොට් 41 සහ 26 (මීටර් 4.5 පළල පාර), දකුණට : පින්කැල්ල සහ මෙහි ලොට් 41 සහ බස්නාහිරට : පින්කැල්ල සහ මෙහි ලොට් 39 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් අටක් (A:0, R:0, P:8) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමඟ එකී අංක 2018/1319 දරන පිඹුරට යොමුව A 811/116 යටතේ මාතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී වල්ගම දකුණ පිහිටි "අමරතුංග වත්ත නොහොත් අමරතුංග වත්ත හි ලොට් 2 සහ අමරතුංග වත්ත, අමරතුංග වත්ත හි ලොට් B හි ලොට් 3, ගස්නාවයේ වත්ත හි ලොට් 1 නොහොත් කලුඅප්පුගේ වත්ත තංඩල්ගේ වත්ත හි ලොට් 1, 3 සහ 4, වෙදකැල්ල හි ලොට් 1, 3 සහ 5, සෙනවීරගේ කොරටුව හි ලොට් A සහ B යයි කියනු ලබන ඒකාබද්ධ ඉඩම්වල ලොට් X හි ලොට් X1 හි උප බෙදුම" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. සමරසිංහ යන අය විසින් සාදන ලද 2018 ජනවාරි මස 23 දාතම හා අංක 2018/1319 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 41 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙහි ලොට් 40 සහ 26 (මීටර 4.5 පළල පාර), නැගෙනහිරට : මෙහි ලොට් 42 සහ 26 (මීටර් 4.5 පළල පාර), දකුණට : මෙහි ලොට් 42 සහ පින්කැල්ල සහ බස්නාහිරට : මෙහි ලොට් 40 සහ පින්කැල්ල යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් අටක් (A:0, R:0, P:8) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමඟ එකී අංක 2018/1319 දරන පිඹුරට යොමුව A 811/117 යටතේ මාතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

මතින් යටින් සහ ඉහළින් මාර්ගය භාවිතා කිරීමේ අයිතිය ද සමඟ ය.

1. එකී වල්ගම දකුණ පිහිටි "අමරතුංග වත්ත නොහොත් අමරතුංග වත්ත හි ලොට් 2 සහ අමරතුංග වත්ත, අමරතුංග වත්ත හි ලොට් B හි ලොට් 3, ගස්නාවයේ වත්ත හි ලොට් 1 නොහොත් කලුඅප්පුගේ වත්ත තංඩල්ගේ වත්ත හි ලොට් 1, 3 සහ 4, වෙදකැල්ල හි ලොට් 1, 3 සහ 5, සෙනවීරගේ කොරටුව හි ලොට් A සහ B යයි කියනු ලබන ඒකාබද්ද ඉඩම්වල ලොට් X හි ලොට් X1 හි උප බෙදුම" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. සමරසිංහ යන අය විසින් සාදන ලද 2018 ජනවාරි මස 23 දාතම හා අංක 2018/1319 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 45 (මීටර් 9 පළල පාර) වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මීටර් 9 පළල පාර (අංක 1322 දරන පිඹුරේ ටික්කම්බිගේවත්ත හි ලොට් 1), නැගෙනහිරට : මෙහි ඉඩමේ ලොට් 6 (පොදු අරමුණ සඳහා වෙන්කිරීම) සහ ලොට් 1, 5 (පාර), දකුණට : මෙහි ලොට් 7 (මීටර් 6 පළල පාර) සහ බස්නාහිරට : ටික්කම්බිගේවත්ත හි ලොට් B යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම තුනයි බිංදුවක් (A:0, R:0, P:7.30) විශාල ඉඩම් කොටස එකී අංක 2018/1319 දරන පිඹුරට යොමුව A 811/121 යටතේ මාතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

2. එකී වල්ගම දකුණ පිහිටි "අමරතුංග වත්ත නොහොත් අමරතුංග වත්ත හි ලොට් 2 සහ අමරතුංග වත්ත, අමරතුංග වත්ත හි ලොට් B හි ලොට් 3, ගස්නාවයේ වත්ත හි ලොට් 1 නොහොත් කලුඅප්පුගේ වත්ත තංඩල්ගේ වත්ත හි ලොට් 1, 3 සහ 4, වෙදකැල්ල හි ලොට් 1, 3 සහ 5, සෙනවීරගේ කොරටුව හි ලොට් A සහ B යයි කියනු ලබන ඒකාබද්ධ ඉඩම්වල ලොට් X හි ලොට් X 1 හි උප බෙදුම" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. සමරසිංහ යන අය විසින් සාදන ලද 2018 ජනවාරි මස 23 දාතම හා අංක 2018/1319 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 5 (මීටර් 6 පළල පාර) වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙහි ලොට් 1 සහ 2, නැගෙනහිරට : මෙහි ලොට් 4, 12, 13, 14, 21 සහ 27, දකුණට : මෙහි ඉඩමේ ලොට් 26 (මීටර් 4.5 පළල පාර) සහ මෙම ඉඩමේ ලොට් 6 (පොදු අරමුණ සඳහා වෙන්කරන ලද) සහ බස්නාහිරට : මෙහි ලොට් 28, 20, 15, 11, 6 සහ 45 (මීටර් 9 පළල පාර) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ අටයි දශම අටයි දෙකක් (A:0, R:0, P:18.82) විශාල ඉඩම් කොටස එකී අංක 2018/1319 දරන පිඹුරට යොමුව A 811/81 යටතේ මාතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

3. එකී වල්ගම දකුණ පිහිටි "අමරතුංග වත්ත නොහොත් අමරතුංග වත්ත හි ලොට් 2 සහ අමරතුංග වත්ත, අමරතුංග වත්ත හි ලොට් B හි ලොට් 3, ගස්නාවයේ වත්ත හි ලොට් 1 නොහොත් කලුඅප්පුගේ වත්ත තංඩල්ගේ වත්ත හි ලොට් 1, 3 සහ 4, වෙදකැල්ල හි ලොට් 1, 3 සහ 5, සෙනවීරගේ කොරටුව හි ලොට් A සහ B යයි කියනු ලබන ඒකාබද්ධ ඉඩම්වල ලොට් X හි ලොට් X 1 හී උප බෙදුම" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. සමරසිංහ යන අය විසින් සාදන ලද 2018 ජනවාරි මස 23 දාතම හා අංක 2018/1319 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 7 (මීටර් 6 පළල පාර) වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙහි ලොට් 45 (මීටර් 9 පළල පාර) සහ ටික්කම්බිගේවත්ත හි ලොට් B, නැගෙනහිරට : මෙහි ලොට් 5, 6 (පොදු අරමුණ සඳහා වෙන්කරන ලද) 10, 16, 19 සහ 29, දකුණට : මෙහි ලොට් 26 (මීටර් 4.5 පළල පාර) සහ බස්නාහිරට : මෙම ඉඩමේ 8, 9, 17, 18 සහ 30 සහ ටික්කම්බිගේවත්ත හි ලොට් B යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ අටයි දශම හයයි පහක් (A:0, R:0, P:18.65) විශාල ඉඩම් කොටස එකී අංක 2018/1319 දරන පිඹුරට යොමුව A 811/83 යටතේ මාතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

4. එකී වල්ගම දකුණ පිහිටි "අමරතුංග වත්ත නොහොත් අමරතුංග වත්ත හි ලොට් 2 සහ අමරතුංග වත්ත, අමරතුංග වත්ත හි ලොට් B හි ලොට් 3, ගස්නාවයේ වත්ත හි ලොට් 1 නොහොත් කලුඅප්පුගේ වත්ත තංඩල්ගේ වත්ත හි ලොට් 1, 3 සහ 4, වෙදකැල්ල හි ලොට් 1, 3 සහ 5, සෙනවීරගේ කොරටුව හි ලොට් A සහ B යයි කියනු ලබන ඒකාබද්ධ ඉඩම්වල ලොට් X හි ලොට් X 1 හි උප බෙදුම" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. සමරසිංහ යන අය විසින් සාදන ලද 2018 ජනවාරි මස 23 දාතම හා අංක 2018/1319 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 26 (මීටර් 4.5 පළල පාර) වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙහි ලොට් 34, 33, 30, 7 (මීටර් 6 පළල පාර), 29, 28, 5 (මීටර් 6 පළල පාර), 27, 22 සහ 23, නැගෙනහිරට : මෙහි ඉඩමේ ලොට් 33, 24, 38, 35 (පොදු අරමුණ සඳහා වෙන්කරන ලද), දකුණට : මෙම ඉඩමේ ලොට් 35 (පොදු අරමුණ සඳහා වෙන්කරන ලද) 36, 37, මෙම ඉඩමේ ලොට් X2 සහ ලොට් 38, 39, 40, 41, 42, 43, 44 සහ 25 (මීටර් 4.5 පළල පාර) සහ බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් 35 (පොදු අරමුණ සඳහා වෙන්කරන ලද) 34, 33, 32, 31 සහ 27 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි අටයි දශම එකයි එකක් (A:0, R:0, P:28.11) විශාල ඉඩම් කොටස එකී අංක 2018/1319 දරන පිඹුරට යොමුව A 811/102 යටතේ මාතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

12 - 342/2

## සම්පත් බැංකුව පීඑල්සී
## (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

එම්. රූබසිංහ සහ කේ. බස්නායක
ගිණුම් අංක : 0161 5000 1408.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2019.10.31 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඒ. පී. කහඳව යන අය විසින් ලියා සහතික කරන ලද 2014 ජූලි මස 30 සහ 31 දාතම හා අංක 916, 2016 ජූනි මස 30 දාතම හා අංක 1671 දරන උකස් බැඳුම්කර දෙක සහ මඩකලපුව ප්‍රසිද්ධ නොතාරිස් එෆ්. එම්. නතීර් යන අය විසින් ලියා සහතික කරන ලද 2018 අගෝස්තු 08 දාතම හා අංක 5075 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මෙත්තානන්ද රූබසිංහ සහ කමලාවතී බස්නායක යන අය බන්ධනදායීන් වශයෙන් හා එකී කමලාවතී බස්නායක යන අය උකස්කරු වශයෙන්ද පැහැර ඇති හෙයින් ද,

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඒ. පී. කහඳව යන අය විසින් ලියා සහතික කරන ලද 2013 සැප්තැම්බර් මස 06 සහ 09 දාතම හා අංක 527, 2016 ජූනි මස 30 දාතම හා අංක 1673 දරන උකස් බැඳුම්කර දෙක සහ මඩකලපුව ප්‍රසිද්ධ නොතාරිස් එෆ්. එම්. නතීර් යන අය විසින් ලියා සහතික කරන ලද 2019 ජූලි මස 19 දාතම හා අංක 6297 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මෙත්තානන්ද රූබසිංහ සහ කමලාවති බස්නායක යන අය බන්ධනදායීන් වශයෙන් හා එකී මෙත්තානන්ද රූබසිංහ යන අය උකස්කරු වශයෙන් පැහැර ඇති හෙයින් ද,

එකී අංක 916, 1671, 5075, 527, 1673 සහ 6297 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හාර කෝටි හතලිස් හය ලක්ෂ දහඅට දහස් හත්සිය පනහක (රු. 44,618,750.00) මුදලක් 2019 ඔක්තෝබර් මස 02 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හාර කෝටි හතලිස් හය ලක්ෂ දහඅට දහස් හත්සිය පනහක (රු. 44,618,750.00) මුදලද, 2019 ඔක්තෝබර් මස 03 වැනි දින සිට අංක 916, 1671, 5075, 527, 1673 සහ 6297 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තුන් කෝටි අනූපහ් ලක්ෂ පනස් දහසක (රු. 39,550,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහයි දශම පහක් (12.5%) හා තවත් රුපියල් හතලිස් ලක්ෂයක (රු. 4,000,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහයක් (10%) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 916, 1671, 5075, 527, 1673 සහ 6297 දරන එකී උකස් බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන කේ. පී. එන්. සිල්වා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

1. නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, උතුරු වැව්ගම්පත්තුවේ, උහන ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ, උහන උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ, උහන ග්‍රාමයේ පිහිටි "උහන පැරණිගමහි (කොටසක්)" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. ජී. අමරදේව යන අය විසින් සාදන ලද 2014 ජනවාරි මස 09 දාතම හා අංක 975 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ආර්. බී. හීන්මැණිකා විසින් හිමිකම් කියනු ලබන ඉඩම, නැගෙනහිරට : ඩබ්ලිව්. එම්. ධනපාල විසින් හිමිකම් කියනු ලබන ඉඩම, දකුණට : පාර සඳහා වෙන්කිරීම සහ බස්නාහිරට : ඩී. එම්. ඩිංගිරිබන්ඩා විසින් හිමිකම් කියනු ලබන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිහයි දශම පහක් (A:0, R:0, P:30.5) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සමඟ එකී අංක 975 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරු LDO H 12/75 යටතේ අම්පාර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

එකී උහන ග්‍රාමයේ පිහිටි "උහන පැරණිගම (හි කොටසක්)" යයි කියනු ලබන ගොඩ ඉඩම උහන - 89 ඉඩමෙන් සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ආර්. බී. හීන්මැණිකා විසින් හිමිකම් කියනු ලබන ඉඩම, නැගෙනහිරට : ඩබ්ලිව්. එම්. ධනපාල විසින් හිමිකම් කියනු ලබන ඉඩම, දකුණට : පාර සඳහා වෙන්කිරීම සහ බස්නාහිරට : ඩී. එම්. ඩිංගිරිමැණිකේ විසින් හිමිකම් කියනු ලබන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකක් (A:0, R:1, P:0) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සමඟ වෙළුම/පත්ඉරුව U 34/278 යටතේ අම්පාර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 916, 1671 සහ 5075 මගින් හා ඒ යටතේ උකස්කොට ඇප කොට ඇත.)

2. නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, අම්පාර නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, ජයවර්ධනපුර, අංක W/89[A] දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ, E කලාපයේ පිහිටි "බ්‍රෝඩ්ලෑන්ඩ්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. ජී. අමරදේව යන අය විසින් සාදන ලද 2013 අගෝස්තු මස 02 දාතම හා අංක 61/2013 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : කැඩස්තර සිතියම් අංක 280006හි ලොට් 500 සහ 499, නැගෙනහිරට : කැඩස්තර සිතියම් අංක 280006හි ලොට් 498, දකුණට : කැඩස්තර සිතියම් අංක 280006 හි ලොට් 502 සහ බස්නාහිරට : කැඩැස්තර් සිතියම් අංක 280006 හි ලොට් 503 සහ 500 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි හතරයි දශම හතක් (A:0, R:0, P:24.7) හෝ හෙක්ටයාර 0.0625ක් විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සමඟ එකී අංක 61/2013 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව F 06/109 යටතේ අම්පාර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී ලොට් A පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, අම්පාර නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, ජයවර්ධනපුර, අංක W/89[A] දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ, E කාලපයේ පිහිටි ඉඩමට සර්වේයර් ජෙනරාල් විසින් සත්‍යාපනය කරන ලද කැඩස්තර සිතියම් අංක 280006 හි නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 501 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 500 සහ 499, නැගෙනහිරට : ලොට් 498, දකුණට : ලොට් 502 සහ බස්නාහිරට : ලොට් 503 සහ 500 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර බිංදුවයි දශම බිංදුවයි හයයි දෙකයි පහක් (0.0625 Hec.) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සමඟ එකී කැඩස්තර සිතියම් අංක 280006ට අනුව වෙළුම/පත්ඉරුව F 01/75 යටතේ අම්පාර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 527, 1673 සහ 6297 මගින් හා ඒ යටතේ උකස්කොට ඇප කොට ඇත.)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

12 - 343/1

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

කොගිලන් ජුවෙල් වර්ක්ස් ඇන්ඩ් ඒ. රාමලිංගම් ඇන්ඩ් බී. ජී. එම්. රම්‍යලතා.
ගිණුම් අංක : 0025 1000 3538 සහ 0025 5003 3979.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2019.10.31 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

මුදලක් 2019 සැප්තැම්බර් 25 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් එක්කෝටි හත් ලක්ෂ හතලිස් දහස් හයසිය අනූ හතයි ශත පනස් හයක (රු. 10,740,697.56) මුදල ද, 2019 සැප්තැම්බර් මස 26 වැනි දින සිට අංක 1882, 4198, 1884 සහ 4196 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් අනූ අට ලක්ෂ හැත්තෑ දහස් එකසිය හයයි ශත පනස් හතක (රු. 9,870,106.57) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1882, 4198, 1884 සහ 4196 දරන එකී උකස් බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනවල මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

1. වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, උතුරු පිටිගල් කෝරළේ, අනවිලුඩන් පත්තුවේ, හලාවත නගර සහා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, පිටිපන - දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ, පිටිපන වෝඩ් අංක 07 හි පිටිපන පටුමග සහ හෙට්ටි වීදිය පිහිටි වරිපනම් අංක 10 දරන "නිවස සහ පරිශ්‍රයන්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. ශ්‍රීතරන් යන අය විසින් සාදන ලද 2013 ඔක්තෝබර් මස 05 දාතම හා අංක 5629 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පිටිපන පටුමග, නැගෙනහිරට : හෙට්ටි වීදිය, දකුණට : එම්. තිසේරාගේ නිවස සහ පරිශ්‍රයන් සහ බස්නාහිරට : කඩ්ජු මිස්රියා හමීඩ් මහත්මියට අයිති බලයලත් මානක තැන ඒ. ජී. එස්. ආර්. පරාක්‍රම යන අය විසින් සාදන ලද අංක 106 දරන පිඹුරේ නිරූපිත ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තුනයි දශම දෙකයි බිංදුවක් (A:0, R:0, P:3.20) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමඟ එකී අංක 5629 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව A 104/33 යටතේ (වෙනත් විස්තර තීරුවේ) හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 4198 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

2. වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, උතුරු පිටිගල් කෝරළේ, අනවිලුඩන් පත්තුවේ, හලාවත නගර සහා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, පිටිපන - දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ, පිටිපන වෝඩ් අංක 07 හි පිටිපන පටුමග සහ හෙට්ටි වීදිය පිහිටි පිටිපන පටුමග, වරිපනම් අංක 22 දරන වරිපනම් අංක 22 දරන නිවස සහ පරිශ්‍රයන්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. ශ්‍රීතරන් යන අය විසින් සාදන ලද 2013 ඔක්තෝබර් මස 05 දාතම හා අංක 5630 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පිටිපන පටුමග, නැගෙනහිරට : කඩ්ජුල් මිසරියා හමීඩ් මහත්මියගේ නිවස සහ පරිශ්‍රයන් සහ එම්. තිසේරාගේ නිවස සහ පරිශ්‍රයන්, දකුණට : ලූසියා ප්‍රනාන්දුගේ නිවස සහ පරිශ්‍රයන් සහ බස්නාහිරට : එම්. අයි. ඔලිවියා ප්‍රනාන්දුගේ නිවස සහ පරිශ්‍රයන් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහයි දශම දෙකයි පහක් (A:0, R:0, P:5.25) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමඟ එකී අංක 5630 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව A 104/307 යටතේ හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 4196 මගින් හා ඒ යටතේ උකස්කොට ඇප කොට ඇත.)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

12 - 343/11

---

## සම්පත් බැංකුව පීඑල්සී
## (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

අයි. එම්. ඩී. එන්. බන්ඩාර සහ කේ. එච්. එම්. එස්. ප්‍රනාන්දු.
ගිණුම් අංක : 1030 5724 8679.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2019.10.31 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඒ. ඩී. සුබසිංහ යන අය විසින් ලියා සහතික කරන ලද

2018 ජනවාරි මස 30 දාතම හා අංක 4846 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඉම්හාම් මුදියන්සේලාගේ දයා නිසාමන් බන්ඩාර සහ කෝට්ට හේවගේ මේරියන් සුරේෂා ප්‍රනාන්දු යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 4846 දරන උකස් බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් අසූනම ලක්ෂ දාහත් දහස් හැත්තෑවයි ශත හැත්තෑ හයක (රු. 8,917,070.76) මුදලක් 2019 ඔක්තෝබර් මස 02 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් අසූනම ලක්ෂ දාහත් දහස් හැත්තෑවයි ශත හැත්තෑ හයක (රු. 8,917,070.76) මුදලද, 2019 ඔක්තෝබර් මස 03 දින සිට අංක 4846 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් අසූපන් ලක්ෂ අසූ දහස් පන්සියයක (රු. 8,580,500.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරයි දශම පහක් (14.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 4846 දරන එකී උකස් බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

1. වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරළේ, කම්මල් පත්තුවේ, වෙන්නප්පුව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, වෙන්නප්පුව ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ, වෙන්නප්පුව පිහිටි "කහටගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන වයි. එම්. ආර්. යාපා යන අය විසින් සාදන ලද 2016 ජනවාරි මස 30 දාතම හා අංක 13574 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : චාල්ස් විලියම් මාවත, නැගෙනහිරට : කේ. එච්. ආර්. සී. ප්‍රනාන්දුගේ ඉඩම, දකුණට : ලෙනාඩ් වික්‍රමසිංහ විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ බස්නාහිරට : සිරිල් තමෙල් සහ වෙනත් අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ කලින් ජේ. ජේ. ජයසේකර දැන් ඇන්ටනි ප්‍රනාන්දුගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් හතක් (A:0, R:1, P:7) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 13574 දරන පිඹුරට අනුවය.

බලයලත් මානක තැන එම්. ඩී. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 1994 ජනවාරි 31 දාතම හා අංක 9319 දරන නිරූපිත ඉඩමේ නැවත මිනුමක් වන අංක 13574 දරන පිඹුරේ නිරූපිත එකී ලොට් 1 තවත් අයුරකින් පහත සඳහන් ඉඩමේ නැවත මිනුමකි.

එකී වෙන්නප්පුව පිහිටි "කජුගහවත්ත සහ කහටගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ටී. කේ. ධනසේන යන අය විසින් සාදන ලද 1959 නොවැම්බර් 25 - 1992 දෙසැම්බර් 19 දාතම හා අංක 1198A දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1, 2 සහ 3 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ප්‍රධාන පාර, නැගෙනහිරට : කේ. එච්. ආර්. සී. ප්‍රනාන්දුගේ ඉඩම, දකුණට : ලෙනාඩ් වික්‍රමසිංහ විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ බස්නාහිරට : සිරිල් තමෙල් සහ වෙනත් අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ කලින් ජේ. ජේ. ජයසේකරගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් හතක් (A:0, R:1, P:7) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 13574 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව G 239/111 යටතේ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

12 - 343/12

---

## සම්පත් බැංකුව පීඑල්සී
## (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

එස්. ඩී. ආර්. කේ. සේරම් සහ පී. එන්. ඒ. විජයරත්න.
ගිණුම් අංක : 1114 5780 9902.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2019.10.31 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී. ජේ. අබේවික්‍රම යන අය විසින් ලියා සහතික කරන ලද 2019

මාර්තු 19 දාතම හා අංක 3657 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සේරම්ගේ දොන් රොඩ්නි කීර්ති සේරම් සහ පතිරගේ නිරංජලා අනුරුද්ධිකා විජයරත්න යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 3657 දරන උකස් බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුලු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හැට දෙලක්ෂ අනූ නම දහස් හයසිය දහතුනයි ශත පනස් එකක (රු. 6,299,613.51) මුදලක් 2019 සැප්තැම්බර් මස 17 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හැට දෙලක්ෂ අනූ නම දහස් හයසිය දහතුනයි ශත පනස් එකක (රු. 6,299,613.51) මුදල ද, 2019 සැප්තැම්බර් මස 18 වැනි දින සිට අංක 3657 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පනස් නම ලක්ෂ හැත්තෑ දහස් අටසිය විසි හතයි ශත අනූ දෙකක (රු. 5,970,827.92) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරක් (14%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 3657 දරන එකී උකස් බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, බටකැත්තර දකුණ අංක 565A දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ, බටකැත්තර පිහිටි වරිපනම් අංක 09/02 දරන "හෙඩ්වකගහ එස්ටේට් නොහොත් හෙදවකගහ කනත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එන්. ජයසුන්දර යන අය විසින් සාදන ලද 2016 අගෝස්තු මස 12 සහ 18 දාතම හා අංක 9176 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 13 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අඩි 20 පළල පාර, නැගෙනහිරට : ඊ. කේ. මීපගේ ඉඩම (වරිපනම් අංක 09/01), දකුණට : අංක 603 දරන පිඹුරේ ලොට් 8 සහ කේ. ඩබ්ලිව්. එම්. ඒ. ප්‍රනාන්දුගේ ඉඩම සහ බස්නාහිරට : එල්. ඩබ්ලිව්. ගුණසිංහ සහ ප්‍රසන්න කිතුල්ගොඩගේ ඉඩම් (වරිපනම් අංක 09/06) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ නමයයි දශම දෙකයි බිංදුවක් (A:0, R:0, P:19.20) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 9176 දරන පිඹුරට අනුවය.

බලයලත් මානක තැන එච්. ලාල් ගුණසේකර යන අය විසින් සාදන ලද 1983 මැයි 26 දාතම හා අංක 603 දරන පිඹුරේ නිරූපිත ලොට් 13හි නැවත මිනුමක්වන අංක 9176 දරන එකී පිඹුරේ නිරූපිත එකී ලොට් 13 පහතින් මැනවින් විස්තර කොට ඇත.

එකී බටකැත්තර පිහිටි "හෙඩ්වකගහ එස්ටේට් නොහොත් හෙදවකගහ කනත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. ලාල් ගුණසේකර යන අය විසින් සාදන ලද 1983 මැයි 26 දාතම හා අංක 603 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 13 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අඩි 20 පළල පිවිසුම වන ලොට් 59 පාර සඳහා වෙන්කිරීම, නැගෙනහිරට : මෙහි ලොට් 12, දකුණට : මෙහි ලොට් 7 සහ 8 සහ බස්නාහිරට : මෙහි ලොට් 14 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ නමයයි දශම දෙකයි බිංදුවක් (A:0, R:0, P:19.20) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 603 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රුව C 1001/125 යටතේ දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානක තැන එල්. ගුණසේකර යන අය විසින් සාදන ලද 1989 මැයි 26 දාතම හා අංක 603 දරන පිඹුරේ නිරූපිත ලොට් 59 අඩි 20 ලකුණුකොට ඇති පාර සඳහා වෙන්කිරීම දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතියද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

12 - 341

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංක පී.කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

තෙලිකඩ පල්ලිය ගුරුගේ ලක්ෂ්මන් අනූෂා නාමලි කරුණානායක
ගිණුම් අංකය : 1275000777

2019 ඔක්තෝබර් 25 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. පී. පීරිස් විසින් 2017 ජූනි මස 20 වැනි දින සහතික කරන ලද අංක 472 දරන

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම තෙලිකඩ පල්ලිය ගුරුගේ ලක්ෂ්මන් සහ අනූෂා නාමලි කරුණානායක පැහැර හැර ඇති හෙයින් ද (මෙහි 1 වන උපලේඛනයේ සවිස්තරව විස්තරකර ඇති ඉඩම)

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. පී. පීරිස් විසින් 2017 ජූලි මස 27 වැනි දින සහතික කරන ලද අංක 516 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම තෙලිකඩ පල්ලිය ගුරුගේ ලක්ෂ්මන් සහ අනූෂා නාමලි කරුණානායක පැහැර හැර ඇති හෙයින් ද (මෙහි 2 වන උපලේඛනයේ සවිස්තරව විස්තරකර ඇති ඉඩම)

එකී බැඳුම්කරයන් යටතේ රුපියල් මිලියන විසි හතරයි හැත්තෑ පන් දහස් එකසිය විසි පහයි ශත පනස් එකක (රු. 24,075,125.51) මුදලක් 2019 අගෝස්තු  මස 21 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට දැන් අය විය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන විසි හතරයි හැත්තෑ පන් දහස් එකසිය විසි පහයි ශත පනස් එකක (රු. 24,075,125.51) මුදල අයකර ගැනීම සඳහා සහ 2019 අගෝස්තු මස 22 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 24,075,125.51ක එකී මුදල මත වර්ෂයකට 28% බැගින් වැඩිදුර වාර්ෂික පොළියද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට එකී අංක 472 සහ 516 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත 1වන සහ 2 වන උපලේඛනහි සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ට්ස්ඩෝප් වීදියේ, 2 වැනි මහලේ, අංක 200 දරන ස්ථානයේ බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.  අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### 1 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, කැලණිය ප්‍රාදේශීය සභා සීමා ඇතුළත, අංක 260A දළුගම ග්‍රාම නිලධාරි කොට්ඨාසය සහ කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, දළුගම පිහිටි "මිල්ලගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. පී. විජේවීර විසින් 2014.05.15 වැනි දින පිළියෙල කරන ලද අංක 3537 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 01 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, ඊසානට : අංක 3226 දරන පිඹුරේ ලොට් 01 මගින් ද, ගිණිකොණට : රාජ්‍ය ඉඩම මගින් ද, නිරිතට : ඩබ්. එච්. බී. වීරසිංහ විසින් හිමිකම්ලත් මිල්ලගහවත්ත මගින් ද සහ වයඹට : නුවර පාර මගින් ද මායිම් වූ එකී අංක 3537 දරන පිඹුර ප්‍රකාරව පර්චස් අටයි දශම හතරයි හයක (අ. 0, රූ. 0, පර්. 8.46) හෙවත් හෙක්ටයාර් 0.0214ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව G 179/40 යටතේ ලියාපදිංචි කර ඇත.

### 2 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, කැලණිය ප්‍රාදේශීය සභා සීමා ඇතුළත, අංක 260A දළුගම ග්‍රාම නිලධාරි කොට්ඨාසය සහ කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, දළුගම පිහිටි "මිල්ලගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. එච්. ඒ. නිල්මිණි විසින් 2011.10.28 වැනි දින පිළියෙල කරන ලද අංක 95/2011 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 01 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : නිවුන්හැල්ලගේ ඇල්බර්ට්ගේ ඉඩම මගින් ද, නැගෙනහිරට : සරසවි ෆිල්ම් ස්ටුඩියෝ හි ඉඩම මගින් ද, දකුණට : සරසවි ෆිල්ම් ස්ටුඩියෝ සහ එන්. පෙරේරාගේ ඉඩම් මගින් ද සහ බස්නාහිරට : කොළඹ - නුවර ප්‍රධාන මාර්ගය මගින් ද මායිම් වූ එකී අංක 95/2011 දර පිඹුර ප්‍රකාරව පර්චස් හයයි දශම හතරයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 6.40) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව G 143/50 යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

2019 නොවැම්බර් මස 07 වැනි දින,

12 - 397

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ  4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංක පී.කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

රොහාන් මහේෂ් දූනුවිල.
ණය ගිණුම් අංක : 2281758

2019 සැප්තැම්බර් 27 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එම්. පී. එස්. ජයවීර විසින් 2018 ජූලි 13 වැනි දින සහතික කරන ලද අංක 3624, දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම රොහාන් මහේෂ් දුනුවිල ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් මිලියන හතයි නව ලක්‍ෂ තිස් තුන් දහස් දෙසිය විසි හයයි ශත තිස් හතරක (රු. 7,933,226.34) මුදලක් 2019 අගෝස්තු මස 8 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට දැන් අය විය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන හතයි නව ලක්ෂ තිස් තුන් දහස් දෙසිය විසි හයයි ශත තිස් හතරක (රු. 7,933,226.34) මුදල අය කර ගැනීම සඳහා සහ 2019 අගෝස්තු මස 9 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 7,279,871.97ක මුදලක් මත වර්ෂයකට 13.5% බැගින් වැඩිදුර වාර්ෂික පොළියද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට එකී අංක 3624 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ට්ස්ඩොප් වීදියේ 2 වැනි මහලේ, අංක 200 දරන ස්ථානයේ බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව නාගරික සභා සීමා ඇතුළත, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 582 A පෙලෙන්වත්ත බටහිර ග්‍රාම නිළධාරි කොට්ඨාසය ඇතුළත පෙලෙන්වත්ත හි පිහිටි "සම්බුද්ධි ගොන්නගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ඒ. කේ. එම්. බන්දුලසේන විසින් 2015.05.12 වැනි දින පිළියෙල කරන ලද අංක 238 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 20 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : අංක 1295 දරන පිඹුරේ ලොට් 32 සහ 30 (පාර) මගින් ද, නැගෙනහිරට : අංක 1295 දරන පිඹුරේ ලොට්ස් 30 (පාර) සහ 13 (අඩි 20 පාර) මගින් ද, දකුණට : අංක 1295 දරන පිඹුරේ ලොට්ස් 13 (අඩි 20 පාර) සහ 36 (කාණුව) මගින් ද සහ බස්නාහිරට : පිට ඇළ මගින් ද මායිම් වූ එකී අංක 238 දරන පිඹුර ප්‍රකාරව පර්චස් නවයයි දශම හයක (අ. 0, රූ. 0, පර්. 9.6) විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමඟ වේ.

බලයලත් මිනින්දෝරු අයි. එම්. සී. ප්‍රනාන්දු විසින් 1994.05.10 වැනි දින පිළියෙල කරන ලද අංක 1295 දරන පිඹුරේ ලොට්ස් 30 සහ 13 සහ ඒ. පී. දැරණියගල, එල්. එස්. විසින් 1991.09.25 වැනි දින පිළියෙල කරන ලද අංක 631 දරන පිඹුරේ ලොට් 21ඒ මතින් සහ දිගේ මාර්ගයේ අයිතිය භාවිතා කරන්නට ඇති අයිතිය සමග වේ.

ඉහත ඉඩම පහත සඳහන් ඉඩමෙන් නැවත මැනීමක් වේ.

ඉහත කී පෙලෙන්වත්තහි පිහිටි "සම්බුද්ධි ගොන්නගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු අයි. එම්. සී. ප්‍රනාන්දු විසින් 1994.05.10 වැනි දින පිළියෙල කරන ලද අංක 1295 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 20 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ලොට්ස් 32 සහ 30 මගින් ද, නැගෙනහිරට : ලොට්ස් 30 සහ 13 මගින් ද, දකුණට : ලොට්ස් 13 සහ 36 මගින් ද සහ බස්නාහිරට : පිට ඇළ මගින් ද මායිම් වූ එකී අංක 1295 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහයක (අ. 0, රූ. 0, පර්. 10) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව C 875/56 යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ඒ. පී. රාජපක්‍ෂ,
සමාගම් ලේකම්.

2019 ඔක්තෝබර් මස 22 වැනි දින,

12 - 399

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංක පී.කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

පෙටා ටේලර්ස් ඇන්ඩ් මෙන්'ස් කෝනර් (ප්‍රයිවට්) ලිමිටඩ්
ගිණුම් අංකය : 1275000555
ණය ගිණුම් අංකය : 2136449

2019 ඔක්තෝබර් 25 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. පී. පීරිස් විසින් 2017 ජුනි මස 20 වැනි දින සහතික කරන ලද අංක 473 සහ 2018 මාර්තු 05 වැනි දින සහතික කරන ලද අංක 711 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ශ්‍රී ලංකාවේ නීති යටතේ නිසි පරිදි සංස්ථාපිත සමාගමක් වන කැළණිය, දළුගම, නුවර පාරේ, අංක 09 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති පෙටා ටේලර්ස් ඇන්ඩ් මෙන්'ස් කෝනර් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් සහ තෙලිකඩ පල්ලිය ගුරුගේ ලක්ෂ්මන් සහ අනුෂා නාමලි කරුණානායක උකස්කරුවන් වශයෙන් පැහැර

හැර ඇති හෙයින් ද, (මෙහි 1 වන උපලේඛනයේ සවිස්තරව විස්තරකර ඇති ඉඩම)

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. පී. පීරිස් විසින් 2018 මාර්තු 05 වැනි දින සහතික කරන ලද අංක 709 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ශ්‍රී ලංකාවේ නීති යටතේ නිසි පරිදි සංස්ථාපිත සමාගමක් වන කැළණිය, දළුගම, නුවර පාරේ, අංක 09 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති පෙටා ටේලර්ස් ඇන්ඩ් මෙන්'ස් කෝනර් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් සහ තෙලිකඩ පල්ලිය ගුරුගේ ලක්ෂ්මන් සහ අනූෂා නාමලී කරුණානායක උකස්කරුවන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, (මෙහි 2 වන උපලේඛනයේ සවිස්තරව විස්තරකර ඇති ඉඩම)

එකී බැඳුම්කරයන් යටතේ රුපියල් මිලියන දාහතයි එක් ලක්ෂ දහතුන් දහස් පන්සිය හැත්තෑවක (රු. 17,113,570.00) මුදලක් 2019 අගෝස්තු 21 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට දැන් අය විය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන දාහතයි එක් ලක්ෂ දහතුන් දහස් පන්සිය හැත්තෑවක (රු. 17,113,570.00) මුදල අය කර ගැනීම සඳහා සහ 2019 අගෝස්තු මස 22 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට 7,274,085.61ක මුදලක් මත වර්ෂයකට 28% බැගින් සහ 9,040,400.00ක මුදලක් මත වර්ෂයකට 15.5% බැගින් වැඩිදුර වාර්ෂික පොළියද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට එකී අංක 473, 711 සහ 709 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත 1 වන සහ 2 වන උපලේඛන හි සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ට්ස්ඩෝප් වීදියේ 2 වැනි මහලේ, අංක 200 හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### 1 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, කැලණිය ප්‍රාදේශීය සභා සීමා ඇතුළත, අංක 260 A දළුගම ග්‍රාම නිලධාරි කොට්ඨාසය සහ කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පාලක සීමා තුළ දළුගම පිහිටි "මිල්ලගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. පී. විජේවීර විසින් 2014.05.15 වැනි දින පිළියෙල කරන ලද අංක 3537 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 01 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, ඊසානට : අංක 3226 දරන පිඹුරේ ලොට් 01 මගින් ද, ගිණිකොණට : රාජ්‍ය ඉඩම මගින් ද, නිරිතට : ඩබ්. එච්. බී. වීරසිංහ විසින් හිමිකම්ලත් මිල්ලගහවත්ත මගින් ද සහ වයඹට : නුවර පාර මගින් ද මායිම් වූ එකී අංක 3537 දරන පිඹුර ප්‍රකාරව පර්චස් අටයි දශම හතරයි හයක (අ. 0, රූ. 0, පර්. 8.46) හෙවත් හෙක්ටෙයාර් 0.0214ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියළු දේත් වන මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව G 179/40 යටතේ ලියාපදිංචි කර ඇත.

### 2 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, කැලණිය ප්‍රාදේශීය සභා සීමා ඇතුළත, අංක 260 A දළුගම ග්‍රාම නිලධාරි කොට්ඨාසය සහ කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ දළුගම පිහිටි "මිල්ලගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. එච්. ඒ. නිල්මිණි විසින් 2011.10.28 වැනි දින පිළියෙල කරන ලද අංක 95/2011 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 01 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : නිවුන්හැල්ලගේ ඇල්බර්ට්ගේ ඉඩම මගින් ද, නැගෙනහිරට : සරසවි ෆිල්ම් ස්ටුඩියෝහි ඉඩම මගින් ද, දකුණට : සරසවි ෆිල්ම් ස්ටුඩියෝ සහ එන්. පෙරේරාගේ ඉඩම් මගින් ද සහ බස්නාහිරට : කොළඹ - නුවර ප්‍රධාන මාර්ගය මගින් ද මායිම් වූ එකී අංක 95/2011 දරන පිඹුර ප්‍රකාරව පර්චස් හයයි දශම හතරයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 6.40) විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියළු දේත් වන මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව G 143/121 යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

2019 නොවැම්බර් මස 07 වැනි දින,

12 - 400

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී.කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

කපුගේ චමින්ද පුෂ්පකුමාර සුවන්දහෙන්නදිගේ ඉන්දික තුෂාර
ගිණුම් අංකය : 1750027232
ණය ගිණුම් අංක : 2246493

2019 සැප්තැම්බර් 27 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඒ. සී. එස්. ජයසූරිය විසින් 2015 අගෝස්තු 05 වැනි දින සහතික කරන ලද අංක 3332, 2016 පෙබරවාරි මස 25 වැනි දින සහතික කරන ලද අංක 3703 සහ 2017 මැයි මස 23 වැනි දින සහතික කරන ලද අංක 4357 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඩී. ජී. ජයසූරිය විසින් 2018 අප්‍රේල් මස 18 වැනි දින සහතික කරන ලද අංක 1479 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කපුගේ චමින්ද පුෂ්පකුමාර සහ සුවන්දහෙන්නදිගේ ඉන්දික තුෂාර ණයකරුවන් හැටියට සහ කපුගේ චමින්ද පුෂ්පකුමාර උකස්කරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් මිලියන පහළොවයි එක් ලක්ෂ හැට දෙදහස් තුන්සිය හතලිස් හතයි ශත විසි හයක (රු. 15,162,347.26) මුදලක් 2019 අගෝස්තු මස 27 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට දැන් අය විය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන පහළොවයි එක් ලක්ෂ හැට දෙදහස් තුන්සිය හතලිස් හතයි ශත විසි හයක (රු. 15,162,347.26) මුදල අය කර ගැනීම සඳහා සහ 2019 අගෝස්තු මස 28 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 7,204,474.34ක මුදලක් මත වර්ෂයකට 28% බැගින් සහ රු. 7,066,900.00 මුදලක් මත වර්ෂයකට 16% බැගින් වැඩිදුර වාර්ෂික පොලියද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට එකී අංක 3332, 3703, 4357 සහ 1479 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ට්ස්ඩෝප් වීදියේ 2 වැනි මහලේ, අංක 200 දරන ස්ථානයේ බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, මැද පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමා ඇතුළත, අංක 447A මීගොඩ දකුණ ග්‍රාම නිළධාරී කොට්ඨාසයේ, බැද්දේගෙදරමුල්ල ගමේ පිහිටි "කහටගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආනන්ද ඩී. විතාන විසින් 2014 අගෝස්තු මස 11 වැනි දින පිළියෙල කරන ලද අංක 3676 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1C වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට (බලයලත් මිනින්දෝරු ඒ. ඩී. විතාන විසින් 2008 දෙසැම්බර් මස 12 වැනි දින පිළියෙල කරන ලද අංක 2418 දරන පිඹුරේ දැක්වෙන ඉතුරු ප්‍රදේශයේ උප බෙදීමක් වන) මායිම් වශයෙන්, උතුරට : අංක 3923 දරන පිඹුරේ ලොට් 1 සහ 2 මගින් ද, නැගෙනහිරට : නෙල්සන් අබේරත්න විසින් හිමිකම්ලත් ඉඩම, මෙහි ලොට් 1B සහ ලොට් 1A මගින් ද , දකුණට : අංක 3637 දරන පිඹුරේ ලොට් 3 සහ ලොට් 1ඩී, නෙල්සන් අබේරත්න සහ සෝමපාල විසින් හිමිකම් ලත් ඉඩම් මගින් ද, බස්නාහිරට : අංක 3637 දරන පිඹුරේ ලොට් 1 මගින් ද මායිම් වූ එකී අංක 3676 දරන පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් හතරයි දශම අටයි හතරක (අ. 0, රූ. 1, පර්. 4.84) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමග වේ. හෝමාගම ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව A 390/122 යටතේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු එම්. ජේ. සේතුංග විසින් 2003 ජනවාරි 15 වැනි දින පිළියෙල කරන ලද අංක 3923 දරන පිඹුරේ දැක්වෙන ලොට් 3 සහ 4 ලකුණු කරන ලද අඩි 15 පළල පාර වෙන්කිරීම මතින් සහ දිගේ මාර්ග අයිතිය සහ බලයලත් මිනින්දෝරු ආනන්ද ඩී. විතාන විසින් 2014 මාර්තු මස 11 වැනි දින පිළියෙල කරන ලද අංක 3676 දරන පිඹුරේ දැක්වෙන ලොට් 1D ලකුණු කරන ලද වට රවුම සමඟ වේ.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

2019 ඔක්තෝබර් මස 22 වැනි දින,

12 - 398

---

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

### සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019 ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද රැස්වීමේ දී, පහත සඳහන් යෝජනාව විශේෂයෙන්ම සහ ඒකමතිකව සම්මත කරගන්නා ලදී.

"කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. හසිනි උපුලිකා කුමාරසිංහ විසින් සහතික කරන ලද අංක 212 සහ 2017.08.01 දින දරන උකස් බැඳුම්කරය සහ එම නොතාරිස් විසින් සහතික කරන ලද අංක 440 සහ 2019.01.31 වැනි දින දරන උකස් බැඳුම්කරය ලියා අත්සන් කොට, නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (එකී බැංකුව) නමින් උකස්කොට ඇපයට තබන ලද මෙහි පහත පළමුවන සහ දෙවන උපලේඛනවල සවිස්තරව දැක්වෙන දේපළ සහ පරිශ්‍රය එලෙස උකස්කොට ඇපයට තැබීම මත ප්‍රදානය කරන ලද ණය මුදල්/මූල්‍ය පහසුකම් ගෙවා පියවා දැමීම, වේයන්ගොඩ පදිංචි විජේරත්න ආරච්චිගේ ශනික්

විජේරත්න (ණය ගැණුම්කරු) යන අය විසින් පැහැර හැරීම කර ඇති බැවින් ද,

මෙහි පහත පළමුවන සහ දෙවන උපලේඛනවල සවිස්තරව දැක්වෙන දේපළ සහ පරිශ්‍රයේ සින්නක්කර අයිතිය දරන්නා වන ඉහත කී ණය ගැණුම්කරු විසින් සිය සින්නක්කර අයිතිය, හිමිකම සහ භුක්තිය ඉහත කී අංක 212 සහ 440 දරන උකස් බැඳුම්කර යටතේ එකී බැංකුව වෙත උකසට තබා ඇති බැවින් ද,

ඒ අනුව, ඉහත කී අංක 212 දරන උකස් බැඳුම්කරය සහ අංක 440 දරන උකස් බැඳුම්කරය මත 2019 අගෝස්තු මස 31 වැනි දිනට රුපියල් පනස් හතර ලක්ෂ එකසිය හැත්තෑ එකකුත් ශත හැට නවයක (රු. 5,400,171.69) මුදලක් එකී බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන බැවින් ද,

එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත (එකී ප්‍රධාන පනත) යටතේ එකී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලතල අනුව ක්‍රියාකරමින්, ඉහත කී අංක 212 දරන උකස් බැඳුම්කරය සහ අංක 440 දරන උකස් බැඳුම්කරය මගින් ඇප තබන ලද සහ ඉහත කී අංක 212 දරන උකස් බැඳුම්කරය සහ අංක 440 දරන උකස් බැඳුම්කරය මත එකී බැංකුවට අයවිය යුතු රුපියල් පනස්හතර ලක්ෂ එකසිය හැත්තෑ එකකුත් ශත හැටනවයක (රු. 5,400,171.69) මුදල හෝ එකී දේපළ විකිණීමේ දිනය වන විට එයින් නොගෙවා ඉතිරි වී තිබෙන යම් මුදලක් සහ ඊට අමතරව රුපියල් පන්ලක්ෂ දහනවදහස් පන්සියතිස්හතකුත් ශත විස්සක (රු. 5,019,534.20) මුදල මත 2019 සැප්තැම්බර් මස 01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය තෙක් වර්ෂයකට සියයට විසිඑක (21%) බැගින් පොලිය සහ තව ද, ප්‍රචාරණ සහ දේපළ විකිණීමේ පිරිවැය සහ ප්‍රධාන පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාරව දරා ඇති වෙනත් ගාස්තු යනාදිය සහ තදනන්තරව ගෙවා ඇති යම් මුදලක් (වෙතොත්) එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා ඉහත කී අංක 212 දරන උකස් බැඳුම්කරය සහ අංක 440 දරන උකස් බැඳුම්කරය මගින් එකී බැංකුවට උකසට තබන ලද මෙහි පහත පළමුවන සහ දෙවන උපලේඛනවල සවිස්තරව දැක්වෙන දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන ඩලස් කෙලාට් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### පළමුවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළයේ දාසිය පත්තුවේ, මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ, මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාරපොළ ග්‍රාම නිලධාරි වසමේ, මාරපොළ ගමේ පිහිටි කෝන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. එන්. ඒ. ඩබ්ලිව්. සූරියආරච්චි විසින් මැන සාදන ලද අංක 7697 සහ 2017.06.18 වැනි දින දරන පිඹුරේ ලොට් 3A වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කළ බිම් කොටසට මායිම්, උතුරට : බලයලත් මිනින්දෝරු ටී. ඒ. ඩී. ඒ. සේනානායක විසින් මැන සාදන ලද අංක 221/B දරන පිඹුරේ නිරූපිත ලොට් 02 ද, නැගෙනහිරට : මෙම ඉඩමේම ඉතිරි කොටස ද, දකුණට : අංක 221/B දරන පිඹුරේ නිරූපිත ලොට් 06 (ප්‍රවේශ මාර්ගය) ද, බස්නාහිරට : අංක 221/B දරන පිඹුරේ නිරූපිත ලොට් 06 (ප්‍රවේශ මාර්ගය) ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර් .20) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ, වැවිලි, පළතුරු ආදී සෑම සියලු දේත් සහ ඉහත කී අංක 221/B දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 06 වශයෙන් ලකුණු කරන ලද ප්‍රවේශ මාර්ගය පොදුවේ භාවිතා කොට නඩත්තු කිරීමේ අයිතිය ද සමඟ ය.

ඉහත අංක 7697 දරන පිඹුරේ නිරූපිත එකී ලොට් 3A වනාහි මෙහි පහත සවිස්තරව දක්වා ඇති ඉඩමේ නැවත මැන බෙදා වෙන් කිරීමක් වේ.

ඉහත කී මාරපොළ ගමේ පිහිටි කෝන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. එන්. ඒ. ඩබ්ලිව්. සූරියආරච්චි විසින් මැන සාදන ලද අංක 2411 සහ 2005.02.15 වැනි දින දරන පිඹුරේ නිරූපිත ලොට් 3A වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කළ බිම් කොටසට මායිම්, උතුරට : බලයලත් මිනින්දෝරු ටී. ඒ. ඩී. ඒ. සේනානායක විසින් මැන සාදන ලද අංක 221/B දරන පිඹුරේ නිරූපිත ලොට් 02 ද, නැගෙනහිරට : මෙම ඉඩමේම ඉතිරි කොටස ද, දකුණට : අංක 221/B දරන පිඹුරේ නිරූපිත ලොට් 06 ද, බස්නාහිරට : අංක 221/B දරන පිඹුරේ නිරූපිත ලොට් 06 ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ, වැවිලි, පළතුරු ආදී සෑම සියලු දේත් සහ ඉහත කී අංක 221/B දරන පිඹුරේ නිරූපිත ලොට් 06 වශයෙන් ලකුණු කරන ලද ප්‍රවේශ මාර්ගය පොදුවේ භාවිතා කොට නඩත්තු කිරීමේ අයිතිය ද සමඟ ය. මෙම දේපළ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ K 103/30 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

තව ද, මෙහි ඉහත සවිස්තරව දැක්වෙන ඉඩම් කැබැල්ලේ වර්තමානයේ තිබෙන හෝ මෙහි මින් මතු කලින් කලට සවිකරන හෝ ස්ථිරවම ඇදනු ලබන සියලු සහ සෑම නිශ්චල පිරියත සහ යන්ත්‍රසූත්‍ර, උපකරණ, තිරවුරු, සවිකිරීම් සහ සේවාවන් සහ එමෙන්ම උපකරණ, විදුලි සැපයුම් පද්ධති උපකරණ, ජල සැපයුම් පද්ධති උපකරණ, විදුලි සංදේශ උපකරණ සහ වායුසමීකරණ උපකරණ ද සමඟ ය.

### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළයේ දාසිය පත්තුවේ, මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ, මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාරපොළ ග්‍රාම නිලධාරි වසමේ, මාරපොළ ගමේ පිහිටි කෝන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. මාන්නප්පෙරුම විසින් මැන සාදන ලද අංක 2317 සහ 2018.06.17 වැනි දින දරන පිඹුරේ නිරූපිත ලොට් 01 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කළ බිම් කොටසට මායිම්, උතුරට : බලයලත් මිනින්දෝරු ජේ. ඒ. ඩී. ඒ. සේනානායක විසින් මැන සාදන ලද අංක 221 දරන පිඹුරේ නිරූපිත ලොට් 02 ද, නැගෙනහිරට : එකී අංක 221 දරන පිඹුරේ නිරූපිත ලොට් 04 ද, දකුණට : එකී අංක 221 දරන පිඹුරේ නිරූපිත ලොට්

06 (ප්‍රවේශ මාර්ගය) ද, බස්නාහිරට : බලයලත් මිනින්දෝරු කේ. එන්. ඒ. ඩබ්ලිව්. සූරියආරච්චි විසින් මැන සාදන අංක 7697 දරන පිඹුරේ නිරූපිත ලොට් 01 ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ, වැවිලි, පළතුරු ආදී සෑම සියලු දේත් සමග වන අතර, මෙම දේපළ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ K 513/73 දරන වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

තව ද, ඉහත කී මාරපොළ ගමේ පිහිටි කෝන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. ඒ. ඩී. ඒ. සේනානායක විසින් මැන සාදන ලද අංක 228 වඩාත් නිවැරදිව අංක 221 සහ 1998.07.24 දරන පිඹුරේ නිරූපිත ලොට් 06 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කළ බිම් කොටසට මායිම්, උතුරට : ලොට් 01 සහ 03 ද, නැගෙනහිරට : ලොට් 02, 03, 04 සහ 05 ද, දකුණට : ලොට් 05 සහ ප්‍රධාන පාර ද, බස්නාහිරට : ලොට් 01 ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් විසිපහකුත් දශම දෙකක් (අ. 0, රූ. 0, පර්. 25.2) විශාල ඉඩම් කැබැල්ලේ ප්‍රවේශ මාර්ගය පොදුවේ භාවිතා කොට නඩත්තු කිරීමේ අයිතිය ද සමගය. මෙම දේපළ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ K 513/74 දරන වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

තව ද, මෙහි ඉහත සවිස්තරව දැක්වෙන ඉඩම් කැබැල්ලේ වර්තමානයේ තිබෙන හෝ මෙහි මින් මතු කලින් කලට සවිකරන හෝ ස්ථිරවම ඇදනු ලබන සියලු සහ සෑම නිශ්චල පිරියත සහ යන්ත්‍රසූත්‍ර, උපකරණ, තිරවුරු, සවිකිරීම් සහ සේවාවන් සහ එමෙන්ම උපකරණ, විදුලි සැපයුම් පද්ධති උපකරණ, ජල සැපයුම් පද්ධති උපකරණ, විදුලි සංදේශ උපකරණ සහ වායුසමීකරණ උපකරණ ද සමඟ ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

12 - 336

---

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

### සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019 ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද රැස්වීමේ දී, පහත සඳහන් යෝජනාව විශේෂයෙන්ම සහ ඒකමතිකව සම්මත කරගන්නා ලදී.

"මඩකලපුව ප්‍රසිද්ධ නොතාරිස් වී. කනගරත්නම් මහතා විසින් සහතික කරන ලද අංක 11503 සහ 2017.09.15 වැනි දින දරන උකස් බැඳුම්කරය ලියා අත්සන් කොට නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (එකී බැංකුව) නමින් උකස්කොට ඇපයට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දැක්වෙන දේපළ සහ පරිශ්‍රය එලෙස උකස්කොට ඇපයට තැබීම මත ප්‍රදානය කරන ලද ණය මුදල්/මූල්‍ය පහසුකම් ගෙවා පියවා දැමීම, "නසීම් කජු ප්‍රෙඩක්ෂන්" (DS/ET/RBN/328) යන නාමය සහ විලාසය යටතේ තනි හිමිකාරත්වයක් සහිත ව්‍යාපාරයක් පවත්වාගෙන, මඩකලපුව, ඒරාවූර් 01 යන ලිපිනයේ සුලෙයිමා ලෙබ්බෙ මොහොමඩ් තාලිබීන් (ණය ගැණුම්කරු) යන අය විසින් පැහැර හැරීම කර ඇති බැවින් ද,

මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දැක්වෙන දේපළ සහ පරිශ්‍රයේ සින්නක්කර අයිතිය දරන්නා වන ඉහත කී ණය ගැණුම්කරු විසින් සිය සින්නක්කර අයිතිය, හිමිකම සහ භුක්තිය ඉහත කී අංක 11503 දරන උකස් බැඳුම්කරය යටතේ එකී බැංකුව වෙත උකසට තබා ඇති බැවින් ද,

ඒ අනුව, ඉහත කී අංක 11503 දරන බැඳුම්කරය මත 2019 අගෝස්තු මස 31 වැනි දිනට රුපියල් හැත්තෑදෙලක්ෂ විසිනවදහස් තුන්සිය විස්සකුත් ශත පනස්හතක (රු. 7,229,320.57) මුදලක් එකී බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන බැවින් ද,

එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය, සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත "එකී ප්‍රධාන පනත" යටතේ එකී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලතල අනුව ක්‍රියාකරමින්, ඉහත කී අංක 11503 දරන බැඳුම්කරය මගින් ඇප තබන ලද සහ ඉහත කී අංක 11503 දරන බැඳුම්කරය මත එකී බැංකුවට අයවිය යුතු රුපියල් හැත්තෑදෙලක්ෂ විසිනවදහස් තුන්සිය විස්සකුත් ශත පනස්හතක (රු. 7,229,320.57) මුදල හෝ එකී දේපළ විකිණීමේ දිනය වන විට එයින් නොගෙවා ඉතිරිව තිබෙන යම් මුදලක් සහ ඊට අමතරව රුපියල් හැටහයලක්ෂ හත්දහස් හාරසියහයකුත් ශත තිස්දෙකක (රු. 6,607,406.32) මුදල මත 2019 සැප්තැම්බර් මස 01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය තෙක් වර්ෂයකට සියයට තිහ (30%) බැගින් පොළිය සහ තව ද, ප්‍රචාරණ සහ දේපළ විකිණීමේ පිරිවැය සහ ප්‍රධාන පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාරව දරා ඇති වෙනත් ගාස්තු යනාදිය සහ තදනන්තරව ගෙවා ඇති යම් මුදලක් (වෙතොත්) එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා ඉහත කී අංක 11503 දරන බැඳුම්කරය මගින් එකී බැංකුවට උකසට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දැක්වෙන දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන පී. කේ. ඊ. සේනාපති විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### උපලේඛනය

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, ඒරාවූර් පත්තුවේ, අංක 189B දරන මයිලම්පාවෙලි ග්‍රාම නිලධාරි වසමේ මයිලම්පාවෙලි ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ඊ. කේ. තිසවීරසිංහ විසින්

මැන සාදන ලද අංක 489/2016 සහ 2016.03.30 වැනි දින දරන පිඹුරේ නිරූපිත බිම් කොටසට මායිම් උතුරට : අරුන් විජයකුමාර් සහ තවත් අයගේ ඉඩම ද, නැගෙනහිරට : කරුණාලයම් රශ්ඩ් යන අයගේ ඉඩම ද, දකුණට : සුන්දරම් සහ තවත් අයගේ ඉඩම ද, බස්නාහිරට : විපුලනාදන් පාර ද, යන මෙකී මායිම් තුළ පිහිටි අක්කර එකකුත් රූඩ් එකයි පර්චස් දහතුනයි දශම අටයි නවයක් (අ. 01, රූ. 01, පර්. 13.89) විශාල ඉඩම් කැබැල්ල සහ එහි සියළු අයිතිවාසිකම් ද සමග වන අතර, මෙම දේපළ C 0061/27 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම බලයලත් මිනින්දෝරු ඒ. ඊ. කේ. තිසවීරසිංහ විසින් මැන සාදන ලද අංක 555/2017 සහ 2017.03.26 දරන දරන පිඹුර ප්‍රකාර පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, ඒරාවූර්පත්තු ප්‍රාදේශීය සභා සීමාව තුළ, ඒරාවූර්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 189/B දරන මයිලම්පාවෙලි ග්‍රාම නිලධාරි වසමේ, මයිලම්පාවෙල ගමේ විපුලනන්දපුර වීදියේ පිහිටි "මයිලම්පාවෙලි තෝට්ටම්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ඊ. කේ. තිසවීරසිංහ විසින් මැන සාදන ලද අංක T 555/2007 සහ 2017.03.26 වැනි දින දරන පිඹුරේ නිරූපිත (මා විසින් මැන සාදන ලද අංක 713/2016 සහ 2016.05.16 වැනි දින දරන පිඹුරේ නැවත මැන බෙදීමක් වන) මායිම්, උතුරට : වර්තමානයේ අරුණ විජයකුමාර් මහත්මිය සහ තවත් යන අය විසින් හිමිකම් කියන වත්ත ද, නැගෙනහිරට : වර්තමානයේ කරුණාලායන්ගේ භාරකරුවන් විසින් හිමිකම් කියන වත්ත ද, දකුණට : සුන්දරම් සහ තවත් අය විසින් හිමිකම් කියන වත්ත ද, බස්නාහිරට : පාර (ප්‍රාදේශීය සභා) - විපුලනන්දපුර වීදිය ද යන මෙකී මායිම් තුළ පිහිටි හෙක්ටයාර 0.5410 නොහොත් අක්කර එකකුත් රූඩ් එකයි පර්චස් දහතුනයි දශම අටයි නවයක් (අ. 01, රූ. 01, පර්. 13.89) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි සහ එකී දේපළේ සියළු අයිතිවාසිකම් ද සමග ය.

තව ද, මෙහි ඉහත සවිස්තරව දැක්වෙන ඉඩම් කැබැල්ලේ වර්තමානයේ තිබෙන හෝ මෙහි මින් මතු කලින් කලට සවිකරන හෝ ස්ථිරවම ඇදනු ලබන සියලු සහ සෑම නිශ්චල පිරියත සහ යන්ත්‍රසූත්‍ර, උපකරණ, තිරවුරු, සවිකිරීම් සහ සේවාවන් සහ එමෙන්ම උපකරණ, විදුලි සැපයුම් පද්ධති උපකරණ, ජල සැපයුම් පද්ධති උපකරණ, විදුලි සංදේශ උපකරණ සහ වායුසමීකරණ උපකරණ ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩයේ නියමය පරිදි,

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

12 - 337

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

### සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019 ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද රැස්වීමේ දී, පහත සඳහන් යෝජනාව විශේෂයෙන්ම සහ ඒකමතිකව සම්මත කරගන්නා ලදී.

"ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් අනුරුද්ධිකා එස්. ද සේරම් මහත්මිය විසින් සහතික කරන ලද අංක 460 සහ 2016.06.16 වැනි දින දරන උකස් බැඳුම්කරය ලියා අත්සන් කොට නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (එකී බැංකුව) නමින් උකස්කොට ඇපයට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දැක්වෙන දේපළ සහ පරිශ්‍රය එලෙස උකස්කොට ඇපයට තැබීම මත ප්‍රදානය කරන ලද ණය මුදල්/මූල්‍ය පහසුකම් ගෙවා පියවා දැමීම, හොරම්පැල්ල පදිංචි හේවා පතිරණ මුදියන්සේලාගේ සංජීව (ණය ගැණුම්කරු) යන අය විසින් පැහැර හැරීම කර ඇති බැවින් ද,

මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දැක්වෙන දේපළ සහ පරිශ්‍රයේ සින්නක්කර අයිතිය දරන්නා වන ඉහත කී ණය ගැණුම්කරු විසින් සිය සින්නක්කර අයිතිය, හිමිකම සහ භුක්තිය ඉහත කී අංක 460 දරන උකස් බැඳුම්කරය යටතේ එකී බැංකුව වෙත උකසට තබා ඇති බැවින් ද,

ඒ අනුව ඉහත කී අංක 460 දරන බැඳුම්කරය මත 2019 සැප්තැම්බර් මස 04 වැනි දිනට රුපියල් එක්කෝටි විසිපන්ලක්ෂ දොළොස්දහස් දෙසියඅසූතුනකුත් ශත අනූතුනක (රු. 12,512,283.93) මුදලක් එකී බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන බැවින් ද,

එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය, සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත ("එකී ප්‍රධාන පනත") යටතේ එකී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලතල අනුව ක්‍රියාකරමින්, ඉහත කී අංක 460 දරන බැඳුම්කරය මගින් ඇප තබන ලද සහ ඉහත කී අංක 460 දරන බැඳුම්කරය මත එකී බැංකුවට අයවිය යුතු රුපියල් එක්කෝටි විසිපන්ලක්ෂ දොළොස්දහස් දෙසිය අසූතුනකුත් ශත අනූතුනක (රු. 12,512,283.93) මුදල හෝ එකී දේපළ විකිණීමේ දිනය වන විට එයින් නොගෙවා ඉතිරිව තිබෙන යම් මුදලක් සහ ඊට අමතරව රුපියල් එක්කෝටි හයලක්ෂ හතළිස්පන්දහස් අටසිය අනූතුනකුත් ශත තිස්එකක (රු. 10,645,893.31) මුදල මත 2019 සැප්තැම්බර් මස 05 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය තෙක් වර්ෂයකට සියයට විස්ස (20%) බැගින් පොළිය සහ තව ද, ප්‍රචාරණ සහ දේපළ විකිණීමේ පිරිවැය සහ ප්‍රධාන පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාරව දරා ඇති වෙනත් ගාස්තු යනාදිය සහ තදනන්තරව ගෙවා ඇති යම් මුදලක් (වෙතොත්) එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා

ඉහත කී අංක 460 දරන බැඳුම්කරය මගින් එකී බැංකුවට උකසට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දැක්වෙන දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන ඩලස් කෙලාට් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළයේ, දාසිය පත්තුවේ, මීනුවන්ගොඩ නගරසභා සීමාවේ , මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ, මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බොරගොඩවත්ත ග්‍රාම නිළධාරි වසමේ බොරගොඩවත්ත ගමේ පිහිටි "කොස්ගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඒ. එෆ්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 742/94 සහ 1994.03.01 සහ 1994.03.22 දින දරන පිඹුරේ නිරූපිත (බලයලත් මිනින්දෝරු කේ. ඒ. එෆ්. ප්‍රනාන්දු විසින් 2012.11.26 දිනැති පිටසන යොදන ලද) ලොට් අංක 3 වශයෙන් නිරූපිත බෙදා වෙන්කළ බිම් කොටසට මායිම්, උතුරට : බී. ඒ. ලයනල් සහ තවත් අයගේ ඉඩම ද, නැගෙනහිරට : ඒ. ගුණරත්න සහ ස්විනීතා අමරසිංහ යන අයගේ ඉඩම ද, දකුණට : ලොට් 4 ද, බස්නාහිරට : ලොට් 2 සහ ලොට් 7 ද යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 742/94 දරන පිඹුර අනුව පර්චස් දහයකුත් දශම බින්දුවයි හයක් (අ. 0, රූ. 0, පර්. 10.06) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි, පළතුරු ආදී සෑම සියලු දේත් සමග වන අතර, මෙම දේපළ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 907/226 දරන හිමිකම යටතේ ලියාපදිංචි කරන ලදුව වර්තමානය වන විට ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ K 60/5 වෙත ගෙන ගොස් ඇත.

තව ද, අංක 742/94 දරන පිඹුරේ නිරූපිත ලොට් 07 (අඩි 10ක් පළල පාර) වශයෙන් ලකුණු කරන ලද පාර මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය සහ එහි අනෙකුත් පොදු අයිතිවාසිකම් ද සමඟය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්,
නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී.

12 - 335

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.